විදසිය

[illegible]

4 වෙළුම | 1963 දෙසැම්බර - 2507 උඳුවප් | 9 කලඹ

පටුන

මා-සතුරුව

උළුසුරුව — විලියන් ද සිල්වා [සොයුන් විදූ (B. Sc. (Eng.) Lond.) A. M. I. E. E.]

'ඇ'ගේ පැමිණිල්ල — මොහොටටි දෙණු දේවිදූ

ජෝවු ගල — ඩයිරස් කුමාරසිංහ [ගල්කිස්සේ, සාන්ත තොමෝසු විදුහලේ සොයුන් ඇදුරු]

පාරිභාෂික පවලැවිල්ල —

දූහුත පබඳ —

කව් විවිසුව — භුවන්සිරි ජයකුරු

පුවඟ දිවයින — සිරිමල් රණවැල්ල [විදුලකර සරසවියේ වදරු]

අහස — ලියනගේ ජිනදාස

අත — සඳදස් කෝපරගේවා

පොදු සහතික පත් (G. C. E) රුකුල —

කිතු උපත —

දිස්ත්‍රික් උසාවියේ අපරාද නඩු — දම්මිත්

පිංගෙද ගෙ හැල — අනඳපිය කුඩාසිහි

රුහුණු පුවුල් වීම — සැළකුරු

පහදුව —

උඳුවප් මස —

මිල සත 50 යි

S. L. T. ඉස්තරම් මැ නිපැදවීමෙකි!

ඕඩිකොලෝන්

2505

* ඩීලුක්ස්!
* ඩිවෙනිස්!
* ඩිපොපියුලර්!
* බේබි!

සුවඳ වර්ග

* බේරම!
* බ්‍රිලියන්ටයින්!
* හිසැ ගල්වන තෙල්!
* රවුළ බෑමට පසු අලෙවුන්! (After Shave Lotion)
* සුවඳ විලෙවුන්!
* ලේන්සුවලට නන් මාදිලියේ සුවඳ!

හරය ඔබට යැ! ආඩම්බරය අපට යැ!

ශ්‍රී ලංකා ට්‍රේඩ්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස්

71, ගාලු පාර, ගල්කිස්ස.

එඩියෙන් දැනුමට
දැනුමෙන් එඩියට
පත් වන්නට කියවන්නැ

'එ ඩි ය'

පිටපතෙකැ මිල සත 50 යි
පතිණ මිල සත 10 යි

කලප් 12 කැ ගනු මිල රු. 6.00 යි.
පතිණ මිල සමහ යි

සීමා සහිත
ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

කොළොම - මහනුවර - ගාල්ල
මීගමුව - අනුරාපුර - මාතර

• ලස්සන ගෙදර ගෙ–හිමියාට ආඩම්බරයෙකි!

• ගෙදර ලස්සන කරන්නේ ලස්සන ලී බඩු යි!

මෙන්න එයට තැන
තොග ගණනේ සහ සිල්ලරට
ලී බඩු සපයන්නෝ

'ලක්දිව පර්නිචර් ස්ටෝර්ස්'

මොරටු මුල්ල – මොරටුව.

මා-සතුරුව

ලංකාදිවෙහි නිදහස අවසන් වරට ඔබා-ගෙනැ සිටියෝ ඉංගිරිසි මිනිස්සු යැ. එ හෙයින් ඔහු අප ගේ සතුරෝ වූ හ; අපි ද උන් ගේ මිතුරෝ නො වූමු!

සතුරා හට වුව ද දියුණු වන්නට නො-දෙන්නෝ හැදුණු ලොවේ පහත් මිනිස්සු යැ. ඉංගිරිසිහු ඒ ගණයෙහි නුවූ හ. එ හෙයින් දෝ අපේ නිදහස අපට පවරා පෙරළා යන්නට උනට සිදු වියැ. ඉන් උන් ගේ 'ඉර නොබස්නා' අදිරජයට නම් වූයේ පාඩුවෙකි. එහෙත් උන් ගේ හැදුණු කමට නම් ඉන් වූ හානි නැති.

සතුරා හට දියුණු වන්නට දෙන ඉඩ පසෙකැ තිබියේ වා, අසරණයකුට නැඟෙන්-නට යමෙක් ඉඩ නො දේ නම්, හරස් වැ සිටී නම් ඔහු සැලැකියැ යුතු වන්නේ කවර ගොඩෙකැ ලා ද? සතුරා හට ද දියුණු වන්නට නොදෙන්නා හැදුණු ලොවේ පහත් මිනිසෙක් වේ නම් මෙ සේ අසරණයන් නැඟෙන්නට නොදෙන්නා පහත් මැ පෙළේ එකෙකැ යි නො කියා අන් කුමක් කියමු ද?

අසරණ කම නන් අයුරින් වියැ හැකි යැ: මිල මුදල් අතින්, සුව බල අතින්, නැණ නුවණ අතින් ඈ විසිනි. එහෙත් වයසින් වැඩී-ගත්තවුන් කෙරෙහි දක්නට ලැබෙන මේ අසරණ කමට වඩා වයසින් නුමුහුරා-ගියවුන් – බාලයන් – කෙරෙහි එ වැන්නෙක් වේ නම් ඔවුන් අසරණයන් ගේත් අසරණයන් බව කිව යුතු යැ.

හැදෙන පරපුරේ බාලයෝ බස අතින් හරි මැ අසරණයෝ යැ. උනට නිසි බස් වහර උගන්නට අත දීම හැදුණු වැඩුණු අය ගේ යුතු කම යි.

බාලයනට නිසි බස් වහර උගන්වන්නේ නිවැරැදි රසවත් සුදුසු පත – පොත යි. එ වැනි පත – පොත අප රටෙහි නැත්තේ නො වේ. එහෙත් මේ අසරණයන් කවර වරදක් කළ නිසා ද උනට නිසි බස උගන්නට එ වැනි පොත් නොදෙන්නේ? උනට නැඟෙන්නට අතක් නො දෙන්නේ?

මේ රටේ මහ ඉහළින් පිළිගැනෙන කියවන පොතෙකැ රහ ගිය එඩියෙන් අපි පෙන්නා – දුනුමු. මේ පොත් පෙළෙන් කැරෙන්නේ අසරණ දරුවනට මහ සතුරු කමෙක් නො වේ ද? මෙ බඳු සතුරන් කවර පෙළේ ලා ගනුමු ද?

බසේ සතුරා රැසේ සතුරෙකි; රැසේ සතුරා දෙසේ සතුරෙකි. ඒ හෙයින් බසේ සතුරා මෙ තුනුරුවනේ මැ සතුරෙකි. මෙ තුනු-රුවනට සතුරු වැ සිටින්නා මිනිස් වගේ සතුරෙකි.

"අද සිය බසින් කිසිත් බැරියෝ" යනු අඳෝනා හඬට මුළුමනින් වග කිව යුත්තෝ නම් මේ මිනිස් සතුරු පෙළ යැ. නියම බස දන්නෝත් එ සේ වලපිත් ද?

අද මේ මිනිස් සතුරන් සිය බසින් වැඩ කරන්නට යැ කියා කැස කවා-ගෙනැ වැඩ ඇරැඹූ සැටියෙක් ද පෙනේ. එහෙත් වත්තේ ගහේ කොස් ඉල්ලූ එකාට ලැබුණේ මූදින් එ තෙරැ කොහොඹ යැ! හොඳ නොවැ? සිංහලයෙන් වැඩ කරන්නට සිංහලය ඉල්ලා කෑ – ගැසූ සිංහලයාට පාරිභාෂික කම්මලේ ඇත්තන් කළ හරිය එඩියෙන් පුරා හෙළි වන හෙයින් මේ ඒ පැමට නොතැනි. එහෙත් එකක් කිව යුතු යැ. මූන් සතුරෝ නො වෙත් නම් කවුරු ද, සතුරෝ?

නිරැහින් එන ද ඉඩ මඳ වැ යන ලෙසෙකි!

උෂ්ණයුරුව

ඊලියත් ද සිල්වා

යම් දෙයක් ගෙනැ රත් කළ විටැ කරුණු දෙකෙක් සිදු වේ. එකෙක් නම්, ඒ දෙය යම් කිසි තැප් පමණක් (Quantity of heat) උරා - ගැන්ම යි. මෙ උරා - ගැන්ම හැහැවීමට වෙසෙස් වදනෙක් ඇවැසි යැ. එ බැවින්, 'උරා' යන කිරිය පදයට 'ස' යන උපසග යොද (ස + උරා) 'සවුරා' යන නව කිරිය පදය තනාගනිමු. ඒ දෙ කරුණෙන් අනෙක නම්, ඒ දෙයෙහි රස්නය හෙවත් උෂ්ණයුරුව (Temperature) වැඩි වීම යි. තව අයුරෙකින් කිවහොත්, යම් දෙයක් රත් කළ විටැ එය යම් කිසි තැප් පමණක් සවුරා එහි උෂ්ණයුරුව වැඩි කැරගනි.

එක් බඳු බඳුන් දෙකක් ගෙනැ එකෙකැ දිය අඩක් පුරවා අනෙක් බඳුන මුළුමනින් මැ දියෙන් පුරවා දෙ බඳුන මැ එක් විටැ රත් කළහොත් වනුයේ කිමෙක් ද? අඩක් පිරැවි බඳුනේ ඇති දිය අනෙක් බඳුනේ ඇති දියට වඩා කලින් උතුරන්නට හෙවත් පැසෙන්නට (To boil) වෙයි. එක් මැ ලෙසින් එක් මැ කලක් තුළැ රත් වූ හෙයින් දෙ බඳුන මැ සැවුරු තැප් පමණ සම වෙයි. එහෙත්, එකෙකැ උෂ්ණයුරුව අනෙකෙහි උෂ්ණයුරුවට වඩා බෙහෙවින් වෙනස් යැ. එ බැවින්, යම් දෙයෙකැ ඇති තැප් පමණ එක් ඉරියව්වක් ලෙසත්, එ මැ දෙයෙහි උෂ්ණයුරුව එයට ඉඳුරා වෙනස් ඉරියව්වක් ලෙසත් සැලැකියැ යුතු යැ.

උෂ්ණයුරුව වෙනස් වෙත් මැ එ මැ දෙයෙහි ගති ගුණ ද වෙනස් වෙයි. එ සේ වෙනස් වන එක් ගති ගුණයෙක් නම් එ මැ දෙයෙහි පමණ යි. උෂ්ණයුරුව වැඩි වන ඒ දෙය පමණින් ඇරෙයි (Expands); උෂ්ණයුරුව අඩු වන එය වැරෙයි (contracts). මින් පෙනෙනුයේ ඇරීම ද වැරීම ද උෂ්ණයුරුව හා නෑ කමක් දක්වන බව යි. එ බැවින්, උෂ්ණයුරුවේ තරම මැනුමට ඇරීම, වැරීම යන දෙ ගුණය වහල් කැරැගත හැකි යැ. රසදිය (Mercury) ටිකක් ගෙනැ රත් කළ විටැ එය ඇරෙයි; සිසිල් කළ විටැ වැරෙයි. මෙ සේ වන ඇරීමේ හෝ වැරීමේ හෝ පමණ ඇසට නොපෙනෙනවා වියැ හැකි යි. එහෙත් ඉතා සියුම් සිදුරෙකින් යුත් කද (වීදුරු = Glass) නළයක් තුළැ මේ රසදිය රැඳැවුවහොත් ඇරීම හෝ වැරීම හෝ මඳ වුව ද නළය තුළැ ඇති රසදිය - වැඹ (Column) එහා මෙහා යනවා දිස් වෙයි.

මෙ විලසින් තැනුණෙකි. "උෂ්ණයුරුමනුරුව" (Thermometer) යන්න. මැනීමක් කරනුයේ "මන් + කුරු," "මන්නුරු," "මනුරු" වෙයි. එ බැවින්, උෂ්ණයුරුව මනනුයේ යමෙකින් ද එ උෂ්ණයුරුමනුරුව යි. හැම ගෙදරෙකැ මැ සාහේ ඇති උෂ්ණකටුව ද මෙ වන් උවාරණයෙකි. එය වෙදකම් හා සබැඳිවැ යෙදෙන හෙයින් එය හඳුන්වනුයේ "වෙද උෂ්ණයුරුමනුරුව" (Clinical Thermometer) යනුවෙනි. උෂ්ණකටුව, වෙසෙස් ලෙස තැනුණු උෂ්ණයුරුමනුරුවෙකි. මිනිස් කයෙහි උෂ්ණයුරුවමැනුම එහි කාරිය වෙයි. එ බැවින් එක් පමණෙකැ උෂ්ණයුරුවෙක් පමණි, ඉන් මිනියැ හැකි වනුයේ. උතුරන හෙවත් පැසෙන දියෙහි උෂ්ණකටුව බහාලුව හොත්, එහි රසදිය වේගයෙන් ඇරී කද නළය පුපුරා යෙයි.

උෂ්ණ කටුවෙහි පහළ කෙළවරෙහි රසදිය රඳවන ගබෙක් වෙයි. මෙය හඳුන්වනුයේ රසදිය රඳාර (Mercury reservoir) යනුවෙනි. මේ රඳාර රත් වූ විටැ එහි තුළැ ඇති රසදිය ද රත් වී ඇරෙයි. උෂ්ණකටුවෙහි

රසදිය රඳාර දිව යට තුබූ විටැ, මිනිස් කයෙහි තැප රඳාරට සැව්රෙයි. මේ සැව්රුම නවතිනුයේ රඳාරෙහි උණුසුරුවත් මිනිස් කයෙහි උණුසුරුවත් එක් සම වූ විටැ යැ. එ බැවින් මිනිස් කයෙහි උණුසුරුවට සම වෙයි රසදිය ටැඹෙහි උණුසුරුව. රසදිය ටැඹෙහි ඇරීම අනුවැ එහි උණුසුරුව දත හැකි යැ. ඒ මැ යැ මිනිස් කයෙහි උණුසුරු-වත්. එ සේ වතුදු, උණකටුව දිව යටින් ඉවත් කළ කෙණෙහි මැ එය සිසිල් වනු ඇති. එ සේ සිසිල් වුවහොත් රසදිය ටැඹ පහළ බසී. ඉන් හැඟැවෙනුයේ මිනිස් කයෙහි උණුසුරුව නො වැ එයට අඩු උණු-සුරුවෙකි. මෙය වළක්වනුයේ කෙසේ ද? මේ සඳහා රඳාරෙන් රසදිය පිට වන තැනැ ඇති සිදුර තව ද පටු කැරැ ඇති. ඒ තැන ඉතා පටු උගුරක් ලෙස වෙයි. එ බැවින්, ඇරීමේ බලයෙන් මේ උගුර තුළින් ගිය රසදිය සිසිල් වුව යළි රඳාරට නො එයි. එ සේ ආපසු රඳාරට රසදිය ටැඹ ගෙන්වීමට නම් උණකටුව ගැස්සියැ යුතු වෙයි.

උණුසුරුව මේ තරම් යැ යි දැනැගන්නට නම් උණුසුරුමනුරුවෙහි කඳ ලකුණු කළ යුතු යැ. එ මැ ලකුණු කැරුම වනුයේ මෙ සේ යි. පළමුවෙන් මැ, සොබා දහමේ නියම ලෙස පවත්නා උණුසුරු දෙකක් ගත යුතු වෙයි. මේ දෙකින් පහළ නියම උණුසුරුව ලෙස ගැනෙනුයේ දිය ගන වී හිම ලෙසට හැරෙන විටැ ඇති උණුසුරුව යි. දිය සිසිල් කැරැගෙනැ යත් මැ එක් තැනෙකැ දී පිරිමිදී (Freeze) හිම බවට හැරෙයි. උණුසුරුමනුරුවෙහි රඳාර මේ දියෙහි වී නම්, රසදිය ටැඹ කෙමෙන් කෙමෙන් පහළ බැසැ නැවැතී සිටිනු ඇති. එ විටැ, රසදිය ටැඹෙහි මට්ටම ලකුණ සේ ගෙනැ කඳ කඳෙහි එ තැනැ ලකුණක් යෙදුව එනුයේ පහළ නියම තැන යැ.

ඉක්බිති වැ දිය රත් කළහොත් දියෙහි උණුසුරුව වැඩි වත් මැ, රසදිය ටැඹ කෙමෙන් කෙමෙන් ඉහළ නඟී. මෙ සේ දිය රත් වී – ගෙනැ ගොස් එය උතුරන්නට හෙවත් පැසෙන්නට වන් තැනැ දී රසදිය ටැඹෙහි නැඟීම නවතී. එ විටැ, රසදිය ටැඹෙහි මට්ටම කඳ කඳෙහි ලකුණු කැරු-මෙන් ලැබෙනුයේ ඉහළ නියම තැන යි. පහළ නියම තැනත්, ඉහළ නියම තැනත් අතරැ ඇති කඳ කඳෙහි දිග සියක් කොට-සකට බෙදු ඉන් එක් කොටසක් එක් අංසයක් සේ ගැනෙයි. එ බැවින් පහළ නියම තැන හැඳින්වෙනුයේ අංසක බිංදුව සේ යි; ඉහළ නියම තැන හැඳින්වෙනුයේ අංසක සියය සේ යි. දූන් එක් අංසයක් හඟවන දිග දන්නා හෙයින් සියයට වැඩි අංසක ගණන ද බිංදුවට පහළ රිණ අංසක ගණන ද පහසුවෙන් ලකුණු කළ හැකි වෙයි.

මෙ සේ ලකුණු කැරුණු උණුසුරුමනුරුවට කියනුයේ "සතගිණු" (සැන්ටිග්රේඩ් – (Centigrade) උණුසුරුමනුරුව කියා යි. මේ හැරැ තව ද උණුසුරුමනුරු වගෙක් වේ. "පැරන්හයිට" (Fahrenheit) උණුසුරු-මනුරු යැ ඒ. දනියෙල් පැරන්හයිට යන විද්වා නිපැයුවක් හෙයින් ඒ නම යෙදේ. එහි පහළ නියම තැන ලෙස ගැනුණේ හිම ද ලුණු ද මුසු කළ දියරයෙකැ උණුසුරු-වයි. ඉහළ නියම තැනැ ලෙස ගැනුණේ මිනිස් කයෙහි සමැනි උණුසුරුව යි. එ බැවින්, දිය පිරිමිදුම් උණුසුරුව සතගිණුයේ හැඳින්වෙනුයේ අංසක බිංදුව ලෙසින් වුව ද පැරන්හියිටයේ නම් එය දක්වනුයේ අංසක 32ක් ලෙසට යි. එ මෙන් මැ දිය පැසීමේ උණුසුරුව සතගිණුයේ අංසක 100ක් සේ හැඳින්වුව ද පැරන්හයිටයේ නම් එය අංසක 212ක් සේ දක්වෙයි. සතගිණු අංසක පැරන්-හයිට අංසක සේ පෙරැළම පහත දැක්වෙන සමයුරුවෙන් (Equation) කළ හැකි යි. "පැ" යනු පැරන්හයිට අංසක ලෙසත් 'ස' යනු සතගිණු අංසක ලෙසත් ගෙනැ, බිංදුවට අඩු අංසක රිණ අංසක සේ ද දක්වියැ යුතු යැ. එ විටැ–

පැ = 9/5 ස + 32.

නිදසුන් විසින් සතගිණු අංසක 100 යැ පැරන්හයිට අංසක කීය දැ යි බලමු. සමයුරුව යෙදුමෙන් එනුයේ

පැ = 9/5 × 100 + 32

පැ = 180 + 32 = 212 කි.

මෙ සේ තැනුණු රහදිය උණුයුරුමනුරුවෙන් මැනියැ හැක්කේ ඉමක් ඇති උණුයුරු පමණෙකි. –39°ස හෙවත් සතගිණු රිණ අංසක තිස් නවයක් වූ විටැ රහදිය පිරිමිදී ගන බවට හැරෙයි. ඉදින්, කෙසේ ද රහදිය යොද පහළ උණුයුරු මනිනුයේ? එ මෙන් මැ ඉහළ උණුයුරුවකට රහදිය උණුයුරුමනුරුව මුහුණ දුන හොත්, රහදිය පැසෙයි; කද කඳ ද උණු වී යෙයි. එ බැවින්, අන් උණුයුරු මැනීම සඳහා නොයෙක් පන්නයේ උණුයුරුමනුරු වෙයි. විදිලි උණුයුරුමනුරුව (Electrical Thermometer) එකෙකි. එළියුරු උණුයුරුමනුරුව (Optical Thermometer) තවෙකෙකි.

දෙකක් එකට ඇඳූ විටැ එනුයේ 'දෙ + ඇඳිය, හෙවත් "ඇඳියෙකි." තැප ඇසුරු කරන ඇඳිය "තැප්දැඳිය" ලෙසින් හැඳින්වියැ හැකි. ලෝහ දෙ වගෙකැ තත් දෙකක් ගෙනැ එ මැ තත් දෙකෙහි දෙ කෙළවර එකට පිරිද්දූ කලැ ඇති වනුයේ තැප්දැඳියෙකි. පිරිද්දූ දෙ තැන සන්දි දෙක සේ හැඳින්වෙයි. එක් සන්දියක් සිසිල් කැර අනෙක් සන්දිය රත් කළ කලැ මේ සන්දි දෙක අතර විදිලි තෙරපුවෙක් (Electrical Potential) ඇති වෙයි. මේ දෙ සන්දිය තතෙකින් ඇඳූ කලැ එහි විදිලි දහරෙක් දිවෙයි. මේ දහරෙහි පමණ, සන්දි දෙක අතර ඇති උණුයුරු වෙනස අනුවැ යැ ඇති වනුයේ. එ බැවින්. දහර පමණ අනුවැ උණුයුරුව මැනියැ හැකි වෙයි.

යම් දෙයක් රත් කළ විටැ, එහි උණුයුරු පමණ අනුවැ පැහැති එළියක් විහිදවයි. උණුයුරුව වෙනස් වෙත් මැ විහිදෙන එළියේ පැහැය ද වෙනස් වෙයි. එ බැවින්, කෙන්දක් සහිත විදිලි පහනක් දල්වා එය තුළින් යන විදිලි දහර වෙනස් කරන විටැ කෙන්ද ද පැහැති එළියක් විහිදයි. මෙ දහර හසුරුවා කෙන්දෙන් විහිදෙන පැහැය ද රත් වූ දෙයින් විහිදෙන දහර ද එක් සම සේ ගත හැකි. එ විටැ පහන තුළින් යන විදිලි දහරේ පමණ අනුවැ රත් වූ දෙයෙහි උණුයුරුව වටහා - ගත හැකි යැ. මේ යැ එළියුරු උණුයුරුමනුරුව නම්.

ගැදි තරගය

මැය – සිංහලයා පැවැතෙන්නේ තමා ගෙනැ යි කියනු අසා විජයට සිතුණු දැ

දිනූ පබඳට කිළිණය ලැබෙන්නේ – මොරටුවේ වේල්ස් කුමර විදුහලේ **තිලකා විතාරණ** දේවිය ගෙනි.

ඔබේ පබඳ ජනවාරි මස නො ඉක්මවා එඩියේ සකසුවන් නමට එවන්නැ.

'ඇ'ගේ තොරතුරු

මොහොට්ටි දෙණු දේව්දු

'ඇ' බණවා, ඇයට කියනා සේ පැබැ- දුමෙණකි. මේ පැබැඳුමෙණ් 1935 අවුරුද්දේ දී යැ. එ කලැ පැදිකරු කනංකේ හික්හල්හි විනැයිමේ යෙදී සිටියේ යැ. ඔහුට ඇය ගෙන් වියෝ වීම කිසි සේත් නොකළ හැකි කරුණෙක් වියැ. නොපසු බස්නා විරියෙන් ද, දැඩි එඩියෙන් ද, ඇල්මෙන් ද ඇය හැඳිනැ මැ ඇසුරු කළ හෙයිනි. ඔහු නො බා මැ, එළියේ මැ ඇය හා ඕයෝ වැ වෙසෙනු දුටු ඇතැම්මු ඔහු කෙරේ වෙර බන් හ. තරවටු ද කළ හ. එහෙත් හේ නො වේ, ඇය ගෙන් වියෝ වූයේ. එ හෙයින් හේ එ ද සිටැ මෙ ද තෙක් මැ, ඇය හා ඇලී ගැලී, වෙළී, තිළී හැදී බැදී පැහැදී වෙසේ.

ඇය ඇසුරු කිරීම නිසා, 1935 අවුරුද්දේ, මේ පබඳ කරනා තෙක් පැදි කරු අද්දුටු කරුණු යැ, මෙහි පළ වනුයේ. එ ද ලියූ සැටියෙන් මැ මෙ පබඳ එයි. වෙනසෙක් නොකැරුණේ යැ.

ඇතෙ කැ බොහෝ ඔබ බසැ
සිටිය ද දුල්වා
පාතෙ කැ හෙළු පසු ඇතැ-
මෙක් උඩු බල්වා
මැතෙ කැ කෙනකු යළි ඔබ
නංවන සොල්වා
ආතෙ කැ[1] කුමට?" කියු
සමහරු **"දන් පුල්වා"**

එ හෙත් කෙ සේ වත් එයටො'හු
නො දී සවන්
ස ම ත් බව'හවා නහවා
සැලූ පවන්
ය ළි ත් රුපු දකො'බ පණ
ගසනු නෙතු මූවන්-
අ ය ත් සොවින් මෙන්
කම්මුලෙහි අන දෙවන්

නිසි තැ න නැතො'බෙ'තැන
'රුන නැතැ[2]. සිලුටු නැන
කිසි වෙන කෙනෙක් ඔබ
වෙනුවට ද නොසමන
දි සි ව න නිදසුනුදු රැකියන්
ගෙනැරැ දෙන
රි සි ම න නොමැකියන් අඳ
බිහිරි වන වන-

න හ ව නුවට මැ අත
ගැසූවන් බල සමඟ
හ හ ව නුවටො'බ සිටි
කලැ බස රසැ'ති රඟ
ළ හ ව නු දෙස් දෙනුව
දූනැ ගුරුළු දූමි වග
හි හ ව නුවෝ වෙති රුපු
වැඩි බස් තුඩ'ග

අ ස න් නට ලැබො'බ බෙපේ-
ති යි අසෝ දිහා
ඉගැ න් නුම් මඩුල්ලෙහි
නියුතුවෙක් වහා
ද ම න් නෙමි ගොසෙ'හි
'ඇ' වලන් තුරු වනාහා
ප ව න් පතක් රිසි කම් පෑ
දිනෙකැ අහා!

සො ය න් නකු ගුරුන් කිසි
ලද දිනෙකැ ඉඩක්
නො ද න් වා නැනෙකැ වැඳූ
දූකැ ඔබැ'ති හැඩක්
මු වි න් බිහි වුණා ඔහු
හිස නැමී හඬක්
**"ගු රු න් නාන්සෙට වැලැඳි
නො වෙ ද ලෙඩක්"?**

ගු රු නට දෙ'දිනැ වැලැඳිණි
සෙම් කෝප ලෙඩ
"සු රු – සුරු – සුරුස්" ගැ එ
සෙදෙ'හු දෙරට වැඩ
තු රු නො මැ සිටැ'තුරු
බසකට නහනු තුඩ[3]
තු රු පෙනුණෙ'ව වියැ'සී
අඩි හැපු හඬ[4]

ඔ බ සිටි පමණින් මැ ඒ
මළ බස වත් නත්
ඔ බ සොහොවුරන් වැජැඹෙති
අමුතු යැ යන් නත්
ඔ බ හඬ උසුරුවන කට
කම්මල් යන් නත්
ඔ බ දෙස කිම ඔබ ගණනට
නොගැනෙන්නත්?

උ සු රු ව නු නොපොහොසත්
බව[5] කියතෙ'හි ද
හ සු රු ව නු බසෙහි
අයුතු යැ යනුවෙහි ද
ම සු රු ව නුවනුදු ඔබ බල
ඇසුමෙහි ද
ඉ සුරු [7]ව නු පෙනේ.ඒ සඳ'ර
ලෙඩ කොහි ද?

වි දු සක් විති ගුරුළු දම්
ඈ පෙරැ පඩු වෝ
හු දු හෙළ මුවිනු'සුරුවා
ඔබ පණ වැඩු වෝ
පි දු මෙන් පසු වැ රට
පරනට බල මැඬු වෝ
පූ දු මෙකි! 'නො කියැ-
වියැ හෙමු'' යනු යෙමිනැ'ඹු වෝ

කොතරම් ඔවුන් ඔබ වෙතැ
නො පැව ද රිස්සුම්
ඉ න ක ම් පෑ තැනැත්තන්
හද නැනැ ගැස්සුම්
ඒ ත ර ම් ඔහු බලවති
'නො'බ නො වැ ළිස්සුම්
හි ත ක ම් පැපෑ වැජැඹෙති
රුපු කැරැ'විස්සුම්

ගු රු වරුනුදු උන්
සෝදිසි කරුවනු දු
සු රු වන තුරු රස
බොනු බසැ ගැට නැනු දු
අ රු මෙකැ ඔබ බසැ හා
කටැ හා දැනු දු
උ රු මෙ කැ පසු වැ කියැවේ
උන් ගෙ මුවිනු දු

නැ ති වුව ඔබ බස
නැසෙති යි හද කැක්කුම්
ඇ ති වූ කෙනෙක් බසැ
ලොල් වෙසෙසින් රැක්කුම්
රු ති යෙනි කෙරෙති දුහු
නත් නිසි මහ දැක්කුම්
ග ති නො එ සේ වුව
'හෝ හෙළ බස අක්කුම්?

* * *

1. මහල්ලෙකු. 2. නිසි තැනැ ඔබ නැත, එ තැන අරුත නැත.
3. (ඇසූ පැනයට) උතුරු බසකට තුඩ නගනු තුරු නො මැ සිටැ 5. උසුරුවනු බැහැ
4. අඩි හැපු හඬ ඇසී තුරු(තාරකා) පෙනුණු එව් වියැ. 6. යුතු නැහැ 7 ඉතා සූර.

ජෝඩු ගල

ඩසිරස් කුමාරසිංහ

සිරිපා නඟින්නට කුරුවිට හරහා ද මඟෙක් වෙයි. අඳුරවළ මහ වෙල් යාය පසු කැර යන එ මඟ, කඳු නැඟ – ගෙන ගොස් සැතැපුම් විස්සෙකින් පමණ සමනොළ ගල මුඳුනට ළං වෙයි. කඳු නඟිනා මඟ අසල වෙයි කුඩා ගෙයෙක්. තෙ දිනක් ම එහි නවාතැන් ගතුමු යහළුවෙක් ද මම ද. සිරිපා වඳින්නට යන්නට තතනා, වෙහෙස ව ලත් නවාතැනෙක් නො වේ. එ දෙස වැසියන් ගෙන් යමක් හෝ උන් ගැන යමක් හෝ දැන-ගන්නට ය ගියේ.

ගෙයි වූයේ එක ම එකෙකි; සැට වියට ළං ව සිටියෙකි. කවුරුනුත් ඔහු අමතන්නේ 'බාස් උන්නැහේ' යන නමිනි. එ දෙසට හුරු නමෙකින් ම ඇමැතුණත්, ඔහු ගේ කට නැටැවෙන සැටිය දක්වයි ඔහු එ දෙසට අයත් නොවන එකකු බව. රබර ගස් දෙ දහසකට නො අඩු ගණනෙකින් සැදුණු වත්තක් රක්නා තනතුරු ලැබ මුහුදුබඩින් පැමිණියෙකි හේ. වතු හිමියෝ ඔහුට දැන්වූ හ අප පැමිණීම. අප පැමිණීම ඔහු ගේ මඳ සතුටට කරුණු වුවත් අප නැවැතීම නම් වෙනසක් කෙළේ ය; නොසතුටට මහ පැදුවේ ය. අපට කන්නට බොන්නට දැ පිළියෙල කරන්නට වීම ය නොසතුටට හෙය. අපි ද මුළු තැන් ගෙට වැද අහර පිසින්නට ඔහුට උදවු ව, එහි ම තබා ඔහු හා හවුල් ව අහර වළඳා අර නොසතුට මඳක් මහ හැරවුමු.

හැයි, අහර පිසින්නට එ තරම් මැළි? පිසිනා අඩුවැඩිය නැති නිසා ද? නෑ නෑ. එයින් අඩුවෙක් පාඩුවෙක් නො පෙනේ. ඔහුට කුස ගිනි නො වඳී ද? වඳී, වඳී. එහෙත් ඔහු බලන්නේ නොවෙහෙස ව, ළිප ගිනි නො මොළවා ම, එය නිවා-ගන්නට ය. වේලාව බලා අසල ගෙදරකට යෑම· පමණ ය කැරෙන්නේ. කුස ගිනි නිකම් ම නිවේ.

කෙසේ හෝ වේ වා, ඔහු ගේ කුසෙහි හිස් තැන් තරමට අඩු වූ විට සිතෙහි ද ඉඩෙක් නො ලැබේ දුකට. මහලු කට දොඩන්නට වරම ගන්නේ එ විට ය. මෙ ලක හැම තැන ම ගිය එකෙකි අපේ 'බාසුන්-නැහේ'. ඔහු කීප දෙනකු හා සමඟ එක් ව මැණික් ගරා ඉන් මුදලක් ලැබුණු වහා ම එය ගෙන ඒ මේ තැන ඇවිද මැණික් පතල යළි දූ බලන්නට එන්නේ වියදමට මුදල් හිඟ වන විට ලු. මෙන්න, ඔහු නොගිය තැන් නොවන බව හැඟැවූ සැටි.

'මා ඇවිදින්නට මැ යි කැමැති. මා නොගිය තැනක් ලක්දිවේ කො තැනෙක-වත් නෑ. වෙන තැනක් තබා, අර සුදු ම සුදු ගැහැනුන් සිටිනවා ය කියන පෙදෙසටත් මා ගියා, නම–නම– අනේ මට මතක නෑ. එය නුවරඑළියට ළඟ යි. එහි ගැහැනුන් ගේ රුව තුබුණාට උන් ගේ සිරිත් විරිත් බොහො ම නරක ලු. ඔහු කුඩැල්ලන් වැනි ලු. මැඟියන් ගේ අතේ මිටේ මුදල් නිකම් ම උන් ළඟට ඇදෙනවා ලු. මේ බව ඇසූ නිසා මට එහි යන්නට ම සිතුණා. මගේ අතේ තුබුණා රුපියල් සියයක් පමණ. ඉන් පහක් හයක් ඔඩොක්කුවේ ලා-ගෙන ඉතිරි මුදල් කළවේ බැඳ-ගත්තා; ඉතින් ගියා. ඒත් හරි බියෙන්. එහි ගැහැනුන් ගේ හම නම් සුදු තමා. උන් හට විළි බිය අඩු නිසා මිනිස් සිතට පෙනෙනවා උන් ගේ රූ සිරිය වැඩි ව. එ ද මගේ පස්සෙනුත් එකක ආවා. මා නො නැවතී ම ගියා. ඇත්තෙන් ම මා ගිය ගමන්! දන්නා කියන

කාලේ සිට, මෙන්න මේ අවුරුද්දේ පමණ යි සිරි පා වඳින්නට යන්නට බැරි වුණේ. ඔබ ගියා ද එහි!

අනේ, නෑ.

හා! යන්නට ම ඕනෑ ගමන! සමන් දෙවියන් ගේ අණ ගුණ සිහි කැර- ගෙන ගියා ම ගමන පහසු වෙනවා. නැත් නම් තමා වරදින්නේ!

"කෙසේ ද වරදින්නේ?"

"කෙසේ ද වරදින්නේ! සමහරුන් පිස්සු වැටෙනවා, සමහරුන් වල් වදිනවා, සමහරුන් කොටියාට අසු වෙනවා.

"පිස්සු වැටෙනවා?"

"තවත් අසනවා! වැඩි වියට පැමිණෙන්නට ළං ව සිටිනා ගැහැනු ළමයින් සමඟ යෑම තමා ඉතාමත් නරක. ඒ බඳු එකක ගියොත්, එහි දී ම වියට පැමිණෙනවා. යම් කිසි මුල් වගයක් පෑගීමෙන් එය සිදු වෙනවා ලු. එ විට ඒ ළමයා ගිය නඩේට ම නරක යි. ඇය පිස්සු වැටෙනවා, නැති නම් කොටියාට මස් වෙනවා. අනෙක් අය ද වල් වදිනවා. සමන් දෙවියන් ගේ අනුහස තමා!

"සමන් දෙවියන් ගේ?"

"නැති නම්!"

"සමන් දෙවියන් පෙනෙන්නට එහි සිටිනවා ද?

"පෙනෙන්නට නැහැ. සැම තැන ම සිටිනවා නොපෙනෙන්නට. හදිසියේ පෙනෙන්නටත් එනවා. දුටු අය කිහිප දෙනකු ගැන මා දන්නවා. සුදු හැඳ-ගෙන යි එන්නේ. හා! මට සිහි වුණා දවසක් වුණු දෙයක්. හරි රැවැටීමු එ ද! මාත් යහළුවකුත් ගියා කැලෑ පාරෙකින්. රෑ එකොළහට පමණ ඇති. හඳ එළියත් යන්නම් තුබුණා, එහෙත් හුළු එළියකුත් වන - වනා මා මුලින් ගියා. මට බඹයකට පමණ පස්සෙන් මගේ යහළුවා. බඹ දහයකට පමණ ඉදිරියෙන් මා දුටුවා සුදු ඇඳ-ගත්තකු ඉඳ-ගෙන සිටිනවා. මා ගල් ගැසී නැවැතුණා. යහළුවා ද මට හොඳට ම ළං වුණා. අප දෙ දෙනා ම සිතුවා ඒ සමන් දෙවියන් ම ය කියා. කට වරදී දෝ යන බියෙන් අප එකිනෙකාට කිසිවක් කීවේ නෑ. ළය ද ගැසෙන්නට පටන් ගත්තා! දෙවි ගුණ මෙනෙහි කැර එය නවත්වන්නට පැතුවා. මගේ අතේ තුබුණු හුළු අත්ත ගසෙක හැපුණා මට නො කියාම! ගලක් මෙන් සිටි රුව උඩ පිනුවා, වට පිට බැලුවා, පැන දිව්වා ගස් උඩින්. සමන් දෙවියනැ යි රැවැටුණු සැටි! සැබෑට ම ඒ පමණ ලොකු හැලි වඳුරනුත් සිටිනවා නොවැ!"

මහල්ලා ගේ විසිතුරු ගමන් තොරතුරු කෙළවර නොදක්නා සේ ම යේ. කටට කව ද පණ පොවන්නට මෙන් බුලත් විටක් හපන්නට හේ පටන් ගනී. තොරතුරු රසයෙන් මෙ නෙක් තැළැවුණු අප සිතට දැනෙන්නට වෙයි හුන් අස්නෙන් විසක් අප ඇඟට නඟිනා බවෙක්. එක් වර ම ගත උදු ව සිටී. හා, ඇඟි වතෙහි රතු පෙති කිහිපයෙක් දිවේ! එය ගසා දමන්නට ද මත්තෙන් මහල්ලා මුව මඳක් උඩුකුරු කැර පරෙස්සමෙන් දෙ පදයක් ඉන් පිට කෙරේ.

"මකුණෝ ද?"

"ඔව්. ඇති දූඩි කළ සතුන් වැනි යි.

හේ දෙ තොල තද කැර හකුළුවා මුව මීදුලට දිගු කැර 'පුරුස්' යන හඬින් එය මඳක් හිස් කැර දෙඩුමට ඉඩ දෙයි.

"උනුත් ඉන්නට ඕනෑ නො වැ? කො පමණ සිටියත් මට නම් කිසි ම කරදරයෙක් නෑ.

"උන් ලේ බොන්නේ නැද්ද?"

"මට නම් දැනෙන්නේ නෑ. මෙ පමණ තිබෙන ලෙයින් ටිකක් බීවත් වරදෙක් වෙයි ද?"

''උන් සිටීම හොඳ නෑ, 'බාස් උන්නැහේ.'

''හා, උන් මරන්න ද කියන්නේ? අනේ, මට නම් බැහැ ඒ කරන්න. මැරුවත් කුමට ද? ඉහළ ගෙදරට, පහළ වළව්වට, තේ කඩේට, කො තැනට ගියත් උන් ඉන්නවා. උනුත් ලේ බොනවා. ඉතින් මට හැකි ද ඒ හැම තැන ම මකුණන් මරන්නට''?

ඔහුට යමක් වටහවාලීම එ පමණ ම පහසු නො වේ. ඔහු කියන දෑයට විරුද්ධ දෑයක් ඇසීම ද ඔහුට මහ රිදුමෙකි. හේ මහල්-ලෙක් නොවැ! අපි නිකම් ම සිනාසී එය පිළිගතුමු වෙන අතකට ද හැරවූමු දෙඩුම.

''මේ පෙදෙසෙහිත් මැණික් බොහෝ ම තිබෙනවා ද?''

''ඔව්. බොහෝ ම තිබෙනවා.

''මැණික් ලබන්නට ගරන්නට ම ඕනෑ ද? නො ගරාත් ලබත හැකි ද මැණික්?

''හැකි යි. හැබැයි, ඒ මැණික් ඔබට හොඳ ද?''

''හැයි?''

''හොඳ යි, හෙට උදේ කිරි කපන්නට උන් ආ විට පෙන්නනවා හොඳ ද කියා බලන්න.

මෙයත් සමඟ ම ආ නාකි හිනාව විනාඩි කිහිපයක් ම යේ. රතු බින්දු එයත් සමඟ ම එළියට පනී. එහෙත් කවර හරයෙක් ද හිනාවට? අපි දු එක් වෙමු, නාකි සිතට රුකුල් දෙන්නට. සිනාව මඳක් බාල කැර යළිදු දෙඩයි හේ.

''තරහ වෙන්න එපා. මා කීයේ විහිළුවට. මැණික් ලැබෙන්නේ ලැබීමට වාසනාව තිබෙන අයට. ගැරුවත් නැතත් ලැබෙනවා. සමහර විට ඇළෙක දෙළෙක තිබී-ලා. ඇතැම් විට මහ තිබි-ලා. සමහර අයට මැණික් ලැබුණාට එය තබා ගන්නට බැහැ.

''හැයි? මැණික් දුවනවා ද?''

''ඔව්, දුවන මැණිකුත් තිබෙනවා, ගමන් කරන්නට බැරි මැණික් වුවත්, ඇතැම් විට ලැබූ තැනැත්තාට එහි පල ගන්නට බැරි වෙනවා. ළඟ දී මේ අසල ගමෙක ගැහැනියක ගියා පිහිල්ලට දිය ගෙනෙන්නට. කළය දිය පිරෙන්නට තුබුවාට පසු පිහිල්ලේ යමක් 'ටක ටක' ගා පෙරළී එනවා ඇසුණා. ඈ බැලුවා, අනේ, කො පමණ ලස්සන ගලෙක් ද? දිලිසෙන සැටි! එය පෙරළී අවුත් වැටුණා කළය තුළට. ඈ කළය ගෙන වහා ගෙදර ආවා. එහි දී මැණික ගෙන කට ලොකු බෝතල-යෙක ලා පෙට්ටියෙහි තැබුවා, කාටත් හොරෙන්. ඉන් පසු ඈට හිස ඇම්මක් ආවා, උණත් ටිකක් ගත්තා, ඇගේ සැමියා අවුත් තනි කමකට යැ යි සිතා ඇදුරු කමක් කැරවුවා. එහෙත් උණෙහි අඩුවෙක් නෑ. එය වැඩි වැඩි ව නගිනවා. යන්තම් ටිකක් නින්ද ගිය විට ඈ සිහිනයක් දුටුවා. නාකි කෙනකු අවුත් කීවා අර මැණික අර දිය පිහිල්ලට ම ගෙන ගොස් දමන්නට. නැත්-නම් ඈ මරන බව කීවා. ඔහු ඇඳ සිටියේ තනි ම තනි සුදු ලු. අනේ ඒ ගෑනි බයේ ම ඒ මැණික තුබුණු තැන ම දැමුවා. එ විට යි ලෙඩ සුව වුණෙත්. බලන්න, මැණිකක් අතට පැමිණිලාත් එහි පල ලබන්නට වාසනාව නැති නිසා එය විසි කරන්නට වුණා.

''ඒ සුදෙන් ආවේ කවරෙක් ද''

''ඒ සමන් දෙවියෝ. මේ සමන් දෙවියන්ගේ රට. උන් ගේ අණ සක තමා මෙහි පවතින්නේ. මැණික් ලබන්නට වාසනාව නැති අයට හොඳ ඉල්ලමක් අසු-වන්නට යේ නම් සමන් දෙවියන් උන් බය ගන්වා එළවනවා. ඇතැම් විට වාඩියට දුගඳ මැස්සන් වගයක් එවනවා. උන් ගේ ඊම ගැන නො සලකා මැණික් ගැරුවොත් ඒ අයට යම් කිසි අනතුරක් වෙනවා මැ යි.

''අර ගමන් කරන ගල් ය කියේ කවරකට ද?''

''ගමන් ගලට. ඒ එහි මෙහි ගමන් ගන්නවා. දිය යට, පොළොව යට, ඕනෑ ම තැනෙක යනවා. ජෝඩු ගල් ය කියා නව වගයක් තිබෙනවා. එකට · තිබෙන ගල් දෙකකට යි එ සේ කියන්නේ. ඉන් එකක් පිරිමි ගල, අනෙක ගැහැනු ගල. පිරිමි ගලට ගමන් කරන්නට පුළුවන්. ගැහැනු ගලට නම් බැහැ. යම් තැනකට ගැහැනු ගල ගෙන ගියොත්, එය සොයා – ගෙන පිරිමි ගල එ තැනට එනවා මැයි. යකඩ කරඬු හතෙක වත් ලා නවත්වන්නට බැහැ.''

''මෙ ජෝඩු ගලෙක් අපට බලන්නට කොහි වේ ද''

''අනේ, මා දන්නේ නෑ.''

''ඔබ දැක නැති ද එකක්.''

''හා, දැක තබා, එය ලැබූවකු ගැන අසා වත් නෑ. කොළොඹ මැණික් වෙළෙන්දකු ළඟ දී මට කීවා ජෝඩු ගලේ ගමන දැන් වෙනස් වී තිබෙන බව – නෑ, නෑ – ගමන මාරුවී තිබෙන බව.

''කෙසේ ද?''

''ගැහැනු ගල ලූ දැන් පිරිමි ගල සොයා යන්නේ.''

''ඒ වෙළෙන්ද ළඟ වේ ද ජෝඩු ගලෙක්''

''නෑ.''

''එ සේ නම් ඔහු දන්නේ කෙසේ ද?''

''අනේ, කොළොඹ සිට ඇවිදිනුත් එය නොවැටැහෙන සැටි!'' මහලු කට දෙඩවනු එ තරම් බරෙක් නො වේ. එ කට කො තෙකුත් දෙඩයි. මහලු අයට නිදි අරුම වුණත් තුරුණු අපටත් එ සේ යැ? මහල්ලාට අපේ අමුත්ත වැටැහුණා විය යුතු. එ හෙයින් අපට නිදාගැනුමට අවසර ලැබිණි. එහෙත් නින්දෙහි දී ද මට මතක් වූයේ අර ''ජෝඩු ගල'' ගැන ය.

පරෙවිය

(සාම අස්න)

මෙ තෙක් සිංහලයෙහි ලියැවුණු දිගුතම අසුන් කව යි.

ලොවේ බලවතුන් වෙත සාම අස්නක් ගෙනැ ලොව වටා යන පරෙවියා ගේ ගමන් මගෙහි හමු වන මහ බිම, දිවයින්, මුහුදු, කතර, වන බිම්,. රහ හල්, නළු දසුන් ඈ විසිතුරු වැනුමට ලක් වෙයි.

අරිසෙන් අහුබුදුවන් විසින් පැබැඳිණි.

ලියනගේ ජිනදසුන් ගේ පහදුයෙන් යුතු යැ.

පැදි 501 යි - මිල රු. 5. 00 යි

කොළොඹැ, නොරිස් වීදියේ

මැකලම් පොත් හල

'පාරිභාෂික' පටලැවිල්ල

රජයේ බස සිංහලය වූ ද සිටැ සිංහල සිප් වදන් වෙනුවට කිසි බසකට නැති, **'පාරිභාෂික ශබ්ද' යන්නෙක් සිංහලයා පිටැ පැටැවෙන්නේ යි.**

'පාරිභාෂායෙන්' වැඩ ගන්නට තැතැනුවෝ අවුලෙන් අවුලට මැ වැටුණෝ යි. එහෙත් **'පාරිභාෂාව'** රකින්නට සම්භරැ නැත් දූරැ හ. උනට හිසි පිළිතුරැ සපයන්නට දෝ **රජයේ විදිලි ආදිකාරියත්, ලංකා මිහිතෙල් මඩුල්ලත්** සුදුසු හෙළ සිප් වදන් තනා වැඩට ගත් හ.

ඒ හෙළ සිප් වදන් හැකි තරමින් රටට දෙන්නට ගත් තැනෙකි මේ.

(ගිය කලබ හා බැදෙයි.)

Pack (V) අහුරයි
Packing ඇහිරිය
Packing, Cork කිරිල්ල ඇහිරිය
Paper insulated, lead covered, double steel tape armoured cable. (P. I. L.C. D S. T. O.)
කඩදසි වෙනුරු, ඊයම් කොපුලු, දෙවානේ පටි කවැසු බහන,
(ක. වෙ. ඊ. කො. දෙවා. පටික.)
Paint (V) පැහැතවරයි.
Painter පැහැතවරැ
Paint පැහැතැවැරිය
Painted, Hand අත් - පැහැතැවරු
Pandal තොරණ (*Plural* තොරණ)
Panel තලය
Panel, Feeder පුස්නා තලය
Panel, Metering මැනිරීම් තලය
Parallel operation සමතුරැ මෙහෙයුම
Patrol (V) සැරිරකියි (සරමින් රකිනුයේ)
Patrol, Line රැහැන් සැරිරකුව
Patrolling සැරිරැක්ම
Patron අනුසසු
Payment Slip ගෙවුම් පතිත්ත
Peak කුළ (*plural* කුළු)
Peak load කුළු බැර
Peak load station කුළු බැර පොළ
Pedestal පාතැලිය
Pedestal fan පාතැලි පංකාව
Pendant lamp එලෙන පහන
Pentode පන්දෙරුව (පන් + දෙරැ)
Percentage සියැගිය (සියයට අගයනුයේ = සිය + ඇගි)
Percolate (V) වැහැසේ
Percolation වැහැසීම
Percolator වහස්වනය
Permanent තිර
Permanency තිරයාව
Permanent cultivation තිර වගාව
Permeate (V) උනයි
Permeability ඉනැවියාව
Permeameter ඉනැවිමනුරුව
Permeance ඉනැවිය
Petrol පිරිතෙල්
Petrol, Super සුපිරිතෙල්
Petroleum මිහිතෙල්
Petroleum products මිහිතෙල් නිපැයි
Petrol shed පිරිතෙල් පොළ
Phase කලාව
Phase angle කලා කොනුව
Phase difference කලා වෙනැසිය
Phase, In කලා සම
Phase,, Out of කලා විසම
Phase rotation කලා බුමුව
Phase sequence කලා අන්වය
Phase sequence indicator කලා අන්ව හඟවුව
Phase, Single එක්-කලා
Phase, Six සය-කලා

Phase, Three තෙකලා
Phase, Two දෙකලා
Pick-up (V) ඇහිඳි
Pick-up ඇහිඳිය
Pick-up, Crystal සකැටි ඇහිඳිය
Pick-up, Magnetic යකැති ඇහිඳිය
Pilot cable නියෙමු බහන
Pilot wire නියෙමු තත
Pilot lamp නියෙමු පහන
Pipe නළය
Pipe-line නළ වැල
Pinion පිරණය (පිරි + ඇණය)
Plane යත්න
Plant පිළියත (*plural* පිළියත්)
Plant, Generating දනැවුම් පිළියත්
Plate (V) සුතවරයි
Plate, End අක් තැටිය
Plating සුතැවැරුම
Plating, Barrel බෙර සුතැවැරුම
Plating vat සුතැවැරුම් විත
Plate, Electro - (V) විදුතවරයි
Plating, Electro - විදුතැවැරුම
Plate, Gold (V) රන් සුතවරයි
Plate, Copper (V) තඹ සුතවරයි
Plate, Silver (V) රිදී සුතවරයි
Plug (V) ඔබයි
Plug ඔබුව
Plug, Lampholder අල්ලුඔබුව
Plug, Three pin තෙ-ඇණ ඔබුව
Ply, Two - දෙපතුරලි (දෙ + පතුරු + ඇලි)
Ply, Three - තෙපතුරලි
Ply, Four – සිපතුරලි
Plywood පතුරලි ලෑලි
Pole කනුව
Pole, Intermediate අතුරුමැදි කනුව
Pole, Terminal නිමා කනුව
Pole, Iron යකඩ කනුව
Pole, Lattice රටා කනුව
Pole, End අක් කනුව
Pole Jumper පිනු කනුව
Pole mounting transformer කනු-සවි තරාපැවිය
Pole, Pre-fabricated පෙරගෙතු කණුව
Pole, Pre-stressed පෙරදිකණුව (පෙර + ඇදි)
Pole, Re-inforced වැරකැවූ කනුව
Pole, Steel වානේ කනුව
Pole, Tubular බටයුරු කනුව
Pole, Wood ලී කනුව
Pole, Impregnated wood පොවාලු ලී කනුව

* * *

"හෙළ බස් මව'ජේ,
හෙළ බස් මව'ජේ.
රකිමු වවමු හෙළ බස් මව'ජේ!

තවත් වසර පන්සියයක් ගිය ද මේ,
රජයේ කිසි වැඩකට නොනිසි යැ කියා,

- ඔබ බොක්කට ලූ,
පඩුවෝ හෙළයේ,

- ඔබ හට ඉඩ දී වහා,
නිවන් දකිත්වා!"

— වෙල්ලාල ජයමහ

දුහුන පබඳ

ශිත උපදෙස

ජ. තුවන්සිරි

එක් විසල් වනයෙක
වූයේ මහ. සිහ රජෙක්
ගොදුරු සොයා යන ඔහුට
දිනෙක හමු වී හිවලෙක්.
වැහැරිගිය කයැ'ති
ඒ ජර කැනහිලු දුටු විට
සිහ රජු ගෙ හදවත් කෙතැ
මතු විණි කුලුණු උල්පත.
"ඔබෙ කය ඔ තරම්
දිරැම් කඩට ගියේ කිම?"
සිහ රජු විමසන කී යැ
සිවලා නමා ඳෙ අත මැ.
'දේවයෙනි, සව් සත
හට අහර යි පළමු එක,
එය මැ නැති වුණු විටැ ගත
වැහැරෙනු කවර පුදුම ද?,
"ම–හට සේවය වස්
අව හොත් ඔබ අහර කිස්
රිසි සෙ සැලැසෙනු සැක නැත්"
මෙ සේ වී සිහ රජු බස්.

නින්ද

මෙ ලොව ඔබෙන් වෙන් ව
    කිසි කෙනකුට සිය දිවිය
ගෙන යා නොහැකි බව සැම
    දන්නෝ නිදි දෙවි දුවෙනි.

මහ රටක් රකිනා
    රජකු වුවත් ඔහු ගේ
කරදර ඔබ නිසා ම යි
    මඳකට වුවත් නැසුණේ

කුලීකරුවා ගේ
    වෙහෙසුණු ඇහට ඔබ ගෙන්
ලැබෙන නව දිවියෙන් හේ
    යළි සිය වැඩ කරන්නේ.

උස් පහත් යන කිසි
    බේදුම් නො තකා ඔබ සැම
දෙන වෙත ළං වීම ඔබ
    ගුණය දක්වන්නේ මැ යි.

ඒ ඇසූ සිවලා ද
රජු වෙත රැඳී සේවය
ඇරඹී එ වන රජයේ
පිහිනා ගොදුරු නදියේ

පුස් උඟුරකු අයුරු
වත් මැ ඔහු, නව සිවලෙක්
ළං වී ඔහුට මේ කී
පැ අමුතු හිතවත් කම.

"ඔබ ද සිවපාවෙකි
ඔබ හට ද එක් වලගෙකි
බැළ මෙහෙ ඔයිප් නවනා
රජ වීමට සිතනු යෙහෙ"

* * *

මිතුරු කම   බිඳිනට
උසහන්නවුන්   වදනට
යට වැ රැවැටෙනවුන්   හට
ඉඩ ලැබෙයි   වැනැසෙන්නට

නිහල් හෙපන්ස්තෝල්

රෑ දවල් වෙනසක්
    නො කොට ඔබ කැඳවන සැම
කරා ඒමෙන් ඔබ ගුණ
    තව තවත් වැඩි වන්නේ

ලොවට මෙ තරම් ලොකු
    සහනයක් ගෙන දෙන ඔබ
ඉතා මත් ලස්සන දෙව්
    දුවක විය යුත්තේ මැ යි.
සැම දෙන වෙතට ඔබ
    පැමිණියත් උන් හට ඔබ
ලස්සන වත කිසි දිනෙක
    කිම නො දක්වා යන්නේ?
එන වර මා වෙතට
    ඔබ පැමිණි විට ඔබ ගේ
ඔය වත නො පෙන්වා නම්
    යන්නට නො සිතනු මැනැවි.

(285 පිටට යෙයි.)

කවි විවිසුම

භුවන්සිරි ජයසුරු

නවීන පද්‍ය රචනයේ, "තව ම නූපන් අයට" නමැති කවි පෙළ ය අද අප විවිසුමට ලක් වනුයේ. මෙහි කැපී පැනෙන ලකුණක් ලෙස කිව හැක්කේ කිවියා යොදා-ගෙන ඇති සුගම බස් ආර යි. මෙහි පසු බිම ගැනැ ද බසක් කිව යුතු ය. එයින් මෙහි දැක්වෙන අදහස් නියම ලෙස වටහා-ගන්නට රුකුලෙක් ලැබෙන්නේ යි. මෙය ලියැවී ඇත්තේ 1925 දී පමණ ය. එ කලැ ඉංගිරිසිහු මෙ රට කරවමින් සිටිය හ.

එක එල්ලේ මැ කිසිවකුට පහර නොගසන කිවියා මෙ ලොවට මතු කලැ එන අයට ඔවා දෙයි. එහෙත් කළ යුතු දැ ලෙස ඔහු දක්වන්නේ ඔහු නොකළ යුතු දැ ලෙස සිතූ කරුණු ය. මේ බව පැනෙනුයේ ඔහු වැඩට ගෙනැ ඇති වදන් මාලාවේ දැක්වෙන උවහස සලකා බැලීමෙනි.

එ ලොව සිට එන්නට සිටිනා අය අමතන කිවියා ඔවුනට කල් තබා මැ මෙහි තතුව ගැනැ කරුණු කීමට එළැඹුණු බව ය පළමු වැනි කවියෙන් කියැවෙනුයේ:

"කල දී අපට කිව්වේ නෑ"
කියා ඊට පස්සේ
වැරදි කියනවාට යි දූන් ම
මේවා කියන්නේ."

මෙහි ඇති සුගම බස් ආර කිවියා ගේ අදහස් මැනැවින් සපල කළ බව සිතීමට ඉඩ ඇත්තේ යි.

"රට බොහො ම - අසාර යි." මෙය ද කිවියා විසින් දැක්වුණේ උවහස් පෙරටු කොටැ-ගෙන බව සිතියැ හැකි ය. පෙර සිංහල රජදරුවන් කලැ අස්වද්ද තුබුණු ලක් පොළෝ තලය අසාර බවක් ඇතැම්හු විදෙසි ඇසින් දුට හ. එය මැ මෙහි ලා උවහසින් කියැවුණු සේ යි.

"පිට ඔපයට සූර යි." යනු කීමෙන් කිවියා දක්වන්නේ ඔවුන් තුළැ කිසි දු ගැඹුරු බවක් නොවූ බවත් පිටින් පමණක් මහත් ඔපයක් මවා පා ඇති බවත් ය. කිවියා විසින් මෙයට පන්තිස් වසරකට පෙර දැක්-වුණු මේ අදහස වත්මනටත් ගැළැපෙන සැටි මෙ කව පදය දක්නා විටැ මතක් වන්නේ මැ යි. මේ අදහස මැ තවත් විදහා දක්වන කිවියා මෙ රැවියන් කම්මැලි වූ අතර මැ බාරදූර වූ බවත් පවසයි. ඔවුන් ගේ පුහු ඔපය පැහැදිලි වන්නේ යි.

එ කලැ සිටියවුන් ගේ දිවි මඟ වෙන් වී දැක්වුණේ වල් සිරිත් ඔස්සේ බව ඉන් පසු දැක්වේ. මෙහි 'වල්' යන්නෙන් අදහස් කැරෙන්නේ නොහැදුණු යන්න යි. එ ලෙස හැඩ ගැසුණාහු පිට රටට මැ වදරන්නට පුරුදු වැ සිටි බව කියැවේ. මෙය කැ දෙය වැමැරීම හා සමාන බව දක්වන කිවියා මෙ සේ කියයි:

"පිට රටට වදරයි කාපු දේ වත් වමාරයි"

"ගත සිත නැත උස්සා ආදි ඇත්තන් විලස්සා" යන්නෙන් අපට සිතා ගත හැක්කේ සිතේ එඩිය ආදියෙන් තොර දන රැසක් ඇති වෙමින් සිටි වග ය. පිට රට දැ ම උතුම් කොටැ සලකමින්, තමන් කිසිවකට නුසුදුසු බවට අදිරද වැද්දන් විසින් දෙන ලද අදහස් පිළිගනිමින් හිඟා කෑම ආදියෙන් සිය දිවි පෙවෙත ගත කිරීමට ඇතැම්හු සිතූ හ. එහෙත් "පුටුව පිට මැ රස්සා" වූ පිරිසක් ගැන ද කිවියා දක්වයි. එ බඳු තතුවක් ලැබීමට නම් කළ යුතු දැ ගැන ය ඔහු ඉක්බිති වැ දක්වනුයේ.

''උගත යුතු ය් ''ඉංග්‍රීස්''.
ඒ නමුත් පොඩ්ඩකින් බෑ
එ සැම ඉගෙන ගන්ටත්
ලේසියෙන් ආයුසත් නෑ''

ඉංගිරිසි දැනීම ඇවැසි මැ කරුණක් වූ සේ යි. ඒ දැනුම ලෙහෙසියෙන් ලබා - ගත නොහැකි බවෙකි මෙහි දැක්වෙනුයේ. ආයු කාලය ද මඳ වන සේ ය! සිංහල දැනුම සුළු කොටත් ඉංගිරිසිය මහත් කොටැත් සිතන පිරිසට ඉඟියක් වියැ හැකි ය.

''බී. ඒ'. වලින් වත් සමත් වී'' පැමිණියැ යුතු බව කීමෙන් කිවියා ගේ ඇසට වෙසෙසින් ලක් වූයේ කිසි කමක් නො කොටැ උපාදි හරඹ කරමින් සිටි පිරිස වියැ හැකි ය. එ හෙයිනි ඒ විබෙදුයෙන් සමත් වී මෙහි පැමිණියැ යුතු බව කීයේ.

සිහළ බස, සකුව, පාලිය දැනැගැන්මෙන් පලක් නොවන බව ''තව ම නූපන් අයට'' කිවියා මතක් කරන්නේ උවහස් පෙරටු කොටැ-ගෙනැ යැ. එහෙත් දෙමළ බස දත යුතු බව කියැවේ. ඉංගිරිසියටත් දෙමළ-යටත් වැඩි තැන් තුබුණු සමය අපට මෙයින් සිහියට නැගේ.

කිවියා සිය කලට අයත් ඇතැම් කතුන් ද උවහස් පෙරටු කොටැ සඳහන්නේ, ''පියානා'' හා ''සර්පිනා'' වාදන ඔවුන් විසින් මහ ඉහළින් සැලැකුණු බව පෙන්වයි. ඒ නිසා ය ලක් දිවැ උපදින්නට බලා පොරොත්තු වන ගැහැනුනට ''පියානා'' හා ''සර්පිනා'' වාදන උගන්නා ලෙස ඔහු ඔවා දුන්නේ.

ඉංගිරිසීන්' රට කරවන සමයයේ දී සුදු හමට ඉහළ ම තැන හිමි විය. එ දුටු කිවියා කළු හම අවාසියක් බවත්, සුදු හම නැති නම් වැඳුම් පිදුම් ලබන්නට සායමක් වත් ගෙනා යුතු බවත් කියයි.

එ කලැ පන්නය වූයේ අසත් සිරිත් ඇති වැ සිටීම හා රට දූය වැනැසීම යි. එ හෙයින් මහ තැන් කටයුතු කරන මෙ පිළිවෙළ බලා කටයුතු කළ යුතු බව කිවියා කියයි. ඔහු දෙන අවසන් ඔවය නම් මුතු- මිත්තනට නිහා කිරීම යැ.

මේ කව් පෙළ පොදුවේ සලකා බලන කලැ කිවියා සිය දූයට අත් වැ තුබුණු දරුණු තතුව දැකැ මහත් කැක්කුමෙකින් යුතු වැ ලියූ බව පැනේ. ඔහු නොකළ යුතු දැ ලෙස දැක්වූයේ කළ යුතු දැ බවත් කළ යුතු දැ ලෙස දැක්වූයේ නො කළ යුතු දැ බවත් ඔහු වැඩට ගෙනැ ඇති වදන් මාලා-වෙන් පැහැදිලි වන්නේ යි. ඔහු මෙහි ලා ගෙනැ ඇත්තේ අන් කවිනට බෙහෙවින් වෙනස් මඟෙක් මැ යි.

බස් වහර අතින් මෙහි බෙහෙවින් ගැමි වහර දක්නට ලැබෙන බව පෙනේ. වියත් වහරින් ඔහු පල ගත් බවෙක් නො පැනේ. එහෙත් මෙහි ලා වෙසෙසින් සඳහන් කළ යුත්තේ වියරණ දෙසින් තොර වැ සිය කවි රචනා කිරීමට ජී. එච්. පෙරේරා සමත් වී ඇති බව යි.

මෙ කව් පෙළේ තැනින් තැන නියම උවහස් පෙරටු අදහස් දැක්වීම සඳහා ඉංගිරිසි වදන් යොදන්නට කිවියාට සිදු වී ඇති බව ද කිව යුතු ය. ඒ අතර මැ,- කාර්ය, රක්ෂා, ආයුෂ-වැනි වදන් හෙළ කටට හුරු වන සේ කාරිය, රස්සා, ආයුස ඈ විසින් සකසා ගෙනැ ඇත්තේ යැ අප කිවියා.

* * *

''මුතුයෙහි දිමුතු බව - කොමළ 'හනැ'හැ ලවණ ගුණ
අසිරි රස ද සුකිවි බසැ - කෙ නමැ'ති සේ හඳුන්වති!'
— වීරිත් වැකිය

පූවඟු දිවයින

සිරිමල් රණවැල්ල

යාපනය අර්ධද්වීපයට නිරිත දෙසින්
පිහිටා ඇති පුඞ්කුඩුතිවු හෙවත්
පුඞ්ගුඩුතිවු නමින් හැඳින්වෙන කුඩා දිවයින
වංශකථාවන්හි හා පාළි අටුවාවන්හි සඳහන්-
වන පියඞ්ගුදීප හෙවත් පූවඟු දිවයින
වශයෙන් සාමාන්‍යයෙන් හඳුනාගෙන ඇති.[1]
පූවඟු දිවයින නමින් හැඳින්වුණේ දැනට
පුඞ්කුඩුතිවු නමින් දන්නා කුඩා දූපත යැ යි
අඩමාන කිරීමට උගතුන් පෙලැඹවූයේ
දෙමළපට්ටනමෙහි පිහිටා තිබූ බව කියන
නාගකෝවිල නම් සිඞස්ථානය ගැන නම්
පොත සහ මඟුල් ලකුණ, නම් පොතෙහි
සඳහන් වන තැන සිට පේළි කීපයකට
පහතින් පූවඟු දිවයිනක් ගැන සඳහන්
වීමත් යාපනය දිස්ත්‍රික්කයේ වඩමරච්චි
කොට්ඨාශයේ වල්ලිපුරම් නම් ගමින් ලැබුණු
රන් පතෙක ලියා ඇති, පළමු වැනි ගජබා
රජු ගේ රාජ්‍ය කාලයට අයත් අභිලෙඛන-
යෙක සඳහන් වන 'පියගුක' යන වචනයත්
බව පෙනේ.[2] එක ම නමින් හැඳින්වුණු
ස්ථාන කිහිපය බැගින් ලංකාවේ තුබූ බවට
සාධක ඇති බැවින් නම්පොත සහ මඟුල්
ලකුණෙහි සඳහන් වන පූවඟු දිවයින
ලංකාවේ පිහිටා තුබූ එ නමින් හැඳින්වුණු
එක ම ස්ථානය වශයෙන් සැලැකිය නො
හැකි ය. සමහර විට එය මහාවංසයෙහි
සඳහන් වන විහාරය නොවන්නට පිළිවනි.
එය මහාවංසයෙහි සඳහන් වන පූවඟු
දිවයින ම යැ යි පිළිගන්නට සිදු වුවත් නම්
පොත පරීක්ෂාකාරී ව කියවන කෙනකුට
මේ පූවඟු දිවයින දෙමළපට්ටනමෙහි පිහිටා
තුබූ බවක් නො පෙනේ යැ යි ද දෙමළ-
පට්ටනමෙහි පිහිටා තුබුණේ නාගකෝවිල
පමණක් යැ යි ද කියමින් තර්ක කළ හැකි ය.
දෙමළපට්ටනමෙහි නාගකෝවිල ගැන
සඳහන් කිරීමට තලින් නම්පොතෙහි
'අනුරාධපුරයෙහි ශ්‍රී මහාබෝධින් වහන්සේ,
ලෝවාමහාප්‍රාසාදස්ථානය, මිරිසවැටිය, අභය
-ගිරි විහාරය, ජේතවන විහාරය, රත්නමාලි
චෛත්‍යය, ථූපාරාම චෛත්‍යය, මිහින්තලය
අටසැටලෙන, නිතුපත්පාන, සුරුලු මහමුනි-
යාව, මුත්නේස්සරම, ඇත්තල, මක්කම,
මන්නාරම, මාන්තෝට්ටම, පොන්පරිප්පුව.
මින්විල' යනුවෙන් සඳහන් වෙයි.[3] අනුරාධ-
පුරයෙහි යන වචනයට පසු ව එන සැම
ස්ථානයක් ම පිහිටා තුබුණේ අනුරාධ-
පුරයේ ම යැ යි ගත හොත් නිතුපත්පාන,
සුරුලුමහමුනියාව, මුන්නේස්සරම, ඇත්තල,
මක්කම, මන්නාරම, මාන්තෝට්ටම,
පොන්පරිප්පුව, මින්විල ආදි අනුරාධපුරයෙන්
බැහැර පිහිටා තුබූ ස්ථාන ද අනුරාධපුරයේ ම
පිහිටා තිබූ ස්ථාන වශයෙන් සැලැකීමට
සිදු වෙයි. දෙමළපට්ටනමෙහි යන වචනයට
පසු ව මොල්ලියාව, තිරිකුණාමලය, විල්ගම්-
වෙහෙර, තිස්ස මහවෙහෙර ඉලන්දගොඩ
ආදි වූ ස්ථාන කිහිපයක් ගැන ද කියැවෙයි.[4]
පූවඟු දිවයින දෙමළපට්ටනමෙහි පිහිටා
තිබිණැ යි සලකතොත් තිරිකුණාමලය
විල්ගම් වෙහෙර තිස්ස මහවෙහෙර හා
ඉලන්දගොඩ වෙහෙර ද දෙමළපට්ටනමෙහි ම
පිහිටා තිබිණැ යි සැලැකීමට සිදු වෙයි.
එකකට එකක් ආසන්න ව පිහිටා නො
තිබුණත් සමාන නම් ඇති සමහර ස්ථානයන්
එක ම තැනෙක යොදා ඇති බව නම්පොත
කියවන්නකුට පෙනී යන කරුණෙකි.
බුජස්ලෙන, යාම්ලෙන, ජයකඩුලෙන,
සැහැලෙන, කුඹුරුලෙන, රිදීලෙන, ආදි
වශයෙන් ද ඉසිපතනාරාමය, කුසිනාරාමය,
පූර්වාරාමය, දක්ෂිණාරාමය; පශ්චිමාරාමය,
උත්තරාරාමය, සිළුමිණිසෑය, සළුමිණිසෑය,
දෙමළමහසෑය, පොලොන්නරු විහාරය,
සුළුන්නරු විහාරය, සිතුල්පව් විහාරය, ධනං-

ජය විහාරය, කුකුළුවා විහාරය, දිඹුලාගල් විහාරය, ආදි වශයෙන් ද යොද තිබීම උදහරණ වශයෙන් දක්විය හැකි ය.[5] එකට එක් කොට එක තැනෙක යොද ඇති විහාර-ස්ථානයන් සමහරක් එකකට එකක් ආසන්න ව පිහිටා තුබූ බව සැබෑ ය. එහෙත් සමහර විහාර පිහිටා තුබූ බව පෙනෙන්නේ එකකට එකක් යාබද ව නො වේ. පොලොන්-නරු විහාරය ළඟට සුළුන්නරු විහාරය ද ඊළඟට සිතුල්පව් විහාරය ද යොද ඇති. නම්පොත ලියූ කාලයේ දී එ නම් මහනුවර යුගයේ දී පමණ සිතුල්පව් විහාරය වශයෙන් හඳුන්වන්නට ඇත්තේ කතරගමට නුදුරින් පිහිටා ඇති දනට සිතුල්පව්ව නමින් දන්නා විහාරය බවට සැකයෙක් නැති. දිඹුලාගල් විහාරය, මියුගුණවෙහෙර, සොරොන්නා-තොට, බඳුලු වෙහෙර, යුදගනා පිටිය, රුහුණුබද කතරගම ආදි ස්ථාන ගැන සඳහන් කොට ඇත්තේ සිතුල්පව් විහාරයේ නමට පසු ව ය. මෙ ස්ථාන පිහිටා තුබූ පිළිවෙළට ම මේ ලැයිස්තුව සකස් කෙළේ නම් සිතුල්පව් විහාරයේ නම යෙදිය යුතු ව තුබුණේ කතරගම විහාරයේ නමට ඉහළින් හෝ පහළින් ය. තන්නි දිවයින, අග්නි දිවයින, නාග දිවයින පුවඟු දිවයින, කාර දිවයින යන මේ ස්ථාන එක තැන ම යොද ඇත්තේ ද ඒ ස්ථාන නාමයන්හි එන දිවයින යන කොටස ඒ සැම නමකට ම පොදු වූ නිසා විය හැකි ය.[6] දිවයින් සියල්ල ම එක තැනකට ගෙන යෙදීමට නම්පොතේ කර්තෘ අදහස් කෙළේ නම්, නම්පොතේ දක්වෙන පුවඟු දිවයින මහාවංසයෙහි සඳහන්වන පියඞ්ගුදීප යැ යි සැලැකීමට වුව ද බාධාවෙක් නැති.

පුඞ්කුඩුතිවු නමින් දන්නා දිවයින පුවඟු දිවයින වශයෙන් හඳුනාගැනීමට උගතුන් පෙළැඹැවූ අනෙක් සාධකය වල්ලිපුරම් රන් පත් ලිපියෙහි එන 'පියගුක' යන වචනය යි.[7] වල්ලිපුරම් ලිපියෙහි එන 'මහරජ වහයහ රජෙහි අමෙතෙ ඉසිගිරිය නකදිව බුජමෙනි බදකර අතනෙහි පියගුක-තිස විහර කරිතෙ' යන්නට ලංකා ශිලා-ලෙඛන සංග්‍රහය අර්ථ දී ඇත්තේ 'වසභ මහරජු ගේ රාජ්‍ය කාලයේ දී ඇමති ඉසිගිරිය නාගදීපය පාලනය කරන සමයේ දී පියගුක-තිස්ස නමැත්තා බදකර අතනෙහි විහාරය කරවී' යනුවෙනි.[8] 'වසභ මහ රජු ගේ රජ-යෙහි ඇමති ඉසිගිරිය නාගදීපය බුදින්නේ (පාලනය කරන්නේ) බදකරඅතනෙහි පියගුක-තිස්ස නම් විහාරය කරවී' යනුවෙන් ද මීට අර්ථ දිය හැකි ය.[9] මුටසීව රජු ගේ පුත්‍රයකු වූ උද්ධචූළාභය කුමාරයා විසින් මහියඞ්ගණ-ථූපය කැරැවීම පිළිබඳ ව විස්තර කරන වංසත්ථප්පකාසිනිය ඒ සඳහා යොදගෙන ඇත්තේ වල්ලිපුරම් ලිපියේ එන ශෛලියට සමාන ම ශෛලියෙකි. 'බුදුන් පිරිනිවීමෙන් හවුරුදු 236 ක් ඇවෑමෙන්.. ...... මුටසීව රජු ගේ පුත්‍ර උද්ධචූළාභය නම් රාජකුමාරයා ඒ ප්‍රදේශය (මහියඞ්ගණ ප්‍රදේශය) බුදින්නේ ....:......ඒ මෙදවර්ණ පාෂාණ චෛත්‍ය (මහියඞ්ගණ චෛත්‍ය) තිස් රියනක් උසට කරවී ය.' යනු වංසත්ථප්පකාසිනියෙහි එන පාඨය යි.[10] මෙ රන් පත් ලිපියට දෙන ලද දෙ වැනි අර්ථය ගත හොත් පියගුකතිස යන්න විහාරයේ නම වශයෙන් ගත හැකි ය.

එ මෙන් ම පියගුකතිස විහාරය ඉදිකරනු ලැබුයේ ඇමති ඉසිගිරිය විසින් යැ යි ද ගත හැකි ය. මේ අර්ථයට අනුව පියගුකතිස යනුවෙන් හැඳින්වුණේ පුවඟු දිවයිනැ වැසි තිස්ස නම් වූ තැනැත්තෙකැ ගැනීමට ඉඩෙක් නැති. ලිපිය ලැබුණු ස්ථානයේ පිහිටා තුබූ විහාරය පියගුකතිස විහාරය නමින් හැඳින්-වුණා විය හැකි ය. කොළොම්තිස්ස, කොටිතිස්ස, බොධිතිස්ස, දෙවතිස්ස, අවගිරිකතිස, අනුලතිස ආදි නම්වලින් ඇතැම් විහාරයක් හැඳින්වුණාක් මෙනි. සමහර විට පියගුකතිස විහාරය පිහිටා තුබූ වල්ලිපුරම් නම් ගම එ කල පියගුක නමින් හැඳින්විණැ යි අඩමාන කිරීමට ඉඩ ඇති. එ සේ සලකතොත් පියගුක නම් වූ ගම බදකර අතනට අයත් වූවක් සේ සැලැකිය

හැකි ය. පියගුක යන්නට පරව දිවයින යන අදහස දෙන වචනයක් යොද නැති බැවින් එයින් අදහස් කෙළේ පුවඟු දිවයින යැ යි සිතීම දුෂ්කර ය. දනට පුඞ්කුඩුතිවු නමින් දන්නා දිවයින එ කල පුවඟු දිවයින යනුවෙන් හැඳින්විණැ යි මොහොතකට පිළිගැනීමෙන් පසු ව වුව ද පියගුක හා පුඞ්කුඩුතිවු නමින් හැඳින්වුණේ එක ම ස්ථානයක් ය යි සිතීමට වල්ලිපුරම් ලිපියෙන් අනුබලයෙක් නො ලැබේ. පුඞ්කුඩුතිවු නමින් හැඳින්වෙන දිවයින පිහිටා ඇත්තේ වල්ලිපුරම් නමින් දන්නා ස්ථානයට සැතැපුම් විසි පහක් තිහක් පමණ ඇතින්, එ මෙන් ම යාපනය අර්ධද්වීපයෙන් බැහැර මුහුද මැද ස්ථානයෙක බැවිනි.

පියඞ්ගුදීපය පිහිටා තිබුණේ 'මකරුන්ට වාසස්ථාන වූ සාගරය මැද, බව සීහළවත්ථුප්පකරණයෙහි සඳහන් වෙයි.[11] මේ පුවත කියවන කෙනකුට පුවඟුදිවයින පිහිටා තිබෙන්නට ඇත්තේ මුහුද මැද යැ යි තර්ක කළ හැකි ය. එහෙත් 'සාගර' යන වචනය මුහුද හැඳින්වීමට පමණක් නො ව මුල දී ගඞ්ගාවන් හැඳින්වීමටද යොදගෙන ඇති බවට සාධකයක් සීහළවත්ථුප්පකරණයෙන් ම ලැබේ. හරිතාල නම් ගම ගඟක තොටුපොළක් අසල විසූ හරිතාල තිස්සයන් පරීක්ෂා කිරීම පිණිස සක් දෙව් රජු භික්ෂු වේශයක් ගෙන උන් ගේ ගෙදරට පැමිණි බවත් ඒ වේලෙහි හරිතාල තිස්සයනට කෑම පිළියෙළ කොට ඉදිරියෙහි තැබූ උන් ගේ බිරිය අත කට සෝද-ගැනීම සඳහා පැන් කෝප්පය ඔහුට දීමට සැරැසී සිටි බවත් එ කෙණෙහි සක් දෙවු රජු ඔහු සමීපයට අවුත් 'උපාසකය, මා සාගරයෙන් එතර කරව, මම චෛත්‍ය වැඳීම සඳහා අනුරාධපුරයට යමි'යි කී බවත් හරිතාල තිස්ස වත්ථුවෙහි සඳහන් වෙයි.[12] මෙහි 'සාගර' යන වචනය යොද ඇත්තේ ගඟ යන අදහස දීමට බව පැහැදිලි ය. හරිතාල තිස්සයන් විසුයේ ගඟෙක තොටුපළක් අසල බැවිනි. මෙහි එන 'උපාසක මහා තිස්ස, මං උත්තරෙහි සාගර' යන දෙ පදය පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් සිංහලයට නඟා ඇත්තේ ද 'මහාතිස්ස උපාසකය' මා ගඟෙන් එතෙර කරව' යනුවෙනි[13] මේ ගඟ මකරුනට වාසස්ථානවූ බව යට කියන ලදි. මුල දී 'මකර' යන්නෙන් අදසස් කෙළේ කිඹුලා බව පෙන්වන සාධක පැරැණි කැටයම්වලින් ලැබේ. කැටයම්වල දක්වෙන මකරා ප්‍රභවය ලැබුයේ කිඹුලා ගෙන් බව ෆෝගල් පඬිතුමා පෙන්වා දෙයි[14] ඉන්දියාවේ බරාබර් කඳු වැටියේ පිහිටා ඇති මෞර්ය යුගයට අයත් ලෙස සලකන ලොමෂ ඍෂි නමින් හැඳින්වෙන ලෙන් විහාරයට ඇතුළු වන දොරටුවට ඉහළින් ඇති මකර තොරණ සඳහා යොද ඇත්තේ කිඹුලන් දෙ දෙනකු ගේ රූප ය. කිඹුලන් දෙ දෙනා ඇතුන් කිහිප-දෙනකු ගිලගැනීමට සැරසෙන ආකාරයෙක් මෙ මකර තොරණින් පිළිබිඹු වෙයි. මෙය දනට ලැබී ඇති පැරැණි ම මකර තොරණ වශයෙන් සැලැකේ.[15] (දිගට පළ වෙයි.)

* * * *

1. Epigraphia Zeylanica (EZ) Vol. IV p 235; Journal of the Ceylon Branch of the Royal Asiatic Society New Series (JCBRASNS) Vol VI p. 84: JCBRAS Vol XXVI: p.13
2. නම්පොත සහ මඟුල් ලකුණ [නම්පොත] ප්‍රකාශක පී. ජේ. කරුණාධාර පි. 3; EZ Vol IV p. 237
3. නම්පොත පි. 3
4. එම පි. 3
5 එම පි. 2,4
6. නම්පොත පි. 3
7. EZ Vol. IV p. 237
8. Ibid p, 237
9. EZ p. 237 f. n. 4
10. Vamsatthappakasini- (Vam) G. P. Malalasekera (1935) p. 99. 19-29
11. සීහළවත්ථුප්පකරණං (සීව) අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුඩදත්ත මහානායක සථවිර [1959] පි. 82
12. සීව පි. 8
13. ඉතා පැරණි සිංහල බණකතා අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුඩදත්ත මහානායක සථවිර [1959] පි. 7
14. Revue des Asiatques (1929–1930) Tome VI Nomere iii pp. 133-147
15. Ibid plate xxxiii The Art of Indian Aslo H. Zimmer. Vol. 1 Plate A 3b

අහස

ලියනගේ ජිනදාස්

අපට අහස නිල් පැහැයෙන් පෙනෙයි. සමහර විටැ එ නිල් පැහැය වසා පාවෙන සුදු, අඳුරු වලා පෙනෙයි. උදයත් සවසත් මේ වලා නන් පැහැ ගෙනැ විසිතුරු වැ සැදී සිටියි.

දවල් කල්හි හිරු ද රෑ කල්හි සඳ හා තරු ද පෙනෙ යි. පුර පසළොස්වක් දිනැ සපිරි වැ බබළන හඳ කෙමෙන් අඩු වී ගොස් අමාවක් ද අප දසුනෙන් සපුරා ඇත් වෙයි. යළි එයට පසු ද සිට කෙමෙන් වැඩෙයි.

රෑ කල්හි අහස වෙසෙසින් විසිතුරු වනුයේ තරු පෙළ නිසා යැ. මෙ තරු පැහැයෙන් ද තරමින් ද පිහිටීමෙන් ද එක් බඳු නො වෙයි.

අපට පෙනෙන්නට ඇති තරු ගහයන්, තාරකාවන් යැ යි දෙ වගයකට බෙදියැ හැකි යැ.

තාරකාවන් ගේ එළිය සැලෙයි. ඔවුන් ගේ පිහිටීම තිර යැ. ගහයන් ගේ එළිය නො සැලෙයි. ඔවුන් අහසේ ගමන් කරනු පෙනේ.

ගහයෝ:-

පැළ දිග අය දනැ සිටියේ ගහයන් පස් දෙනකු පමණ යැ. ඔවුන් ගේ බසින් ගහයන් හැඳින්වූයේ 'ඇවිදින්නෝ' යන අරුත ඇති 'ප්ලැනට්ස්' යන නමින් යැ.

ගැලිලියෝ ඔහු ගේ නලික්සුව අහස දෙසට හරවන තෙක් ගහයන් පිළිබඳ වැ පැරැණියන් ගේ දැනුම ඉතා මඳ වියැ. ගහයෝ දෙවියෝ යැ යි පෙර දිග අය කල්පනා කළ හ.

තරු සතර දන්නන් දැනට සොයා-ගෙනැ ඇති ගහයන් ගණන අටෙකි. ඔහු නම්, බුද, සිකුරු, කුජ, ගුරු, සැනි, ඉඳුරු, වරුණ, යම වෙති.

මොහු හැම දෙන ඉරු ගේ දරුවෝ වෙති; පොළොවේ සොහොවුරු - සොහොවිරියෝ වෙති.

අප දන්නා මිම්මෙන් බලන විටැ මොහු අපට ඉතා ළං වැ පිහිටියාහු නො වෙති.

පහතැ පෙනෙන සැටියට ගහ මඬුල්ලේ මාදිළි සටහනක් පිළියෙළ කැරැගත හැකි යැ.

ඉරු දක්විමට තිතක් ලකුණු කැර එයට ඉතා මැ ළං වැ පිහිටි **බුද** අහල් 5 ක් ඇතින් ලකුණු කරන්නැ. **සිකුරු** ලකුණු කළ යුත්තේ අහල් $8\frac{3}{4}$ ක් ඇතින් යැ. අපේ **පොළොව** අඩියක් ඇතින් ලකුණු කළ යුතු යි. ඉරේ සිට අඩි $1\frac{1}{2}$ ක් ඇතින් **කුජ** ගේ තැන වෙයි. අඩි 2 ත් 4 ත් අතරැ කොටසෙහි කුඩා ගහයෝ රැසෙක් වෙති. **ගුරු** ගේ තැන ලකුණු වියැ යුත්තේ අඩි 5 කට මඳක් ඇතිනි. **සැනි** ගේ තැන අඩි $9\frac{1}{2}$ ක් ඇතින් යැ. **ඉඳුරු** අඩි 19 ක් ඇතින් වන අතර **වරුණ** අඩි 30 ක් ඇතින් වෙයි. **යම** ලකුණු කළ යුත්තේ අඩි 40 ඇතින් යැ.

මෙ දක්වූයේ ගහයන් පිහිටීමේ දුර අනුවැ පිළියෙළ කළ හැකි මාදිළියෙකි.

ඉරත් පොළොවත් අතරැ අප දක්වූ අඩියේ දුරින් මයිල 93,003,000 ක් දක්වෙයි. මේ අනුවැ අනෙක් දුර ගණන් සොයා-ගත හැකි ය.

උදහරණය:- ඉරේ සිටැ යමට ඇති දුර = මයිල 93, 003, 000 x 40

- එඩිය **(1952)**

අත

සඳදස් කෝපරහේවා

[1]අතරණ බිඳී දිවි යුද වැඳූ දිරි වරණ
අතරක් නැති වැ මෙහෙයූ ගෙනැ අවි පරණ
අතවර පැමිණි සෙබළකු දැකැ, සරි සරණ
අත සැටි සෙවි සබඳෙක් පිය හිටි කරණ.

අත පැ හිතවතා විමසා, කල ඉදිරි
අත ඉරි රටා පිහිටෙන් තව තව [2]ඉදිරි
අතරක් නැති වැ දෙත, හද මල මිණි දැදිරි
අත ඔහු විමැසුවා ගන්නට හොඳ [3]ඉදිරි.

අත පත් – රුව ද ඔබ හට
සුව වවන අත
[4]අත පත් වන බවට ලකුණු යැ
සවිය [5]අත
[6]අත පසු නො කොටැ, විමැසුව
යෙහෙ තතුව [7]අත
[8]අත ළහැ පෙනෙනු ඇති
සලකුණු නුදුටු අත.

සඳහන් මෙ බස් සඳ රැසිනො'ද
හද අඹර
[9]සඳහත් තරු ද පිරිවර කැරැ
බඳ අඳර
[10]සඳරද වලා පලවා පෙළ
[11]සඳ අදර
සඳනෙහි සුවඳ විඳිනට වියැ
හොඳ ගැඹර

[12]සඳ 'කුරු ලිය ලවා දහරන
නිබඳ [13]සඳ
[14]සඳහත් රිය පෙළ ද ලක් කළ
සබඳ [15]සඳ
[16]සඳ බඳ අඳර කඳ දුරු කළ
සරද [17]සඳ
[18]සඳ ගති හැඳිනැ ගෙනැ සැනැසෙන
ළබඳ [19]සඳ

අතෙක් මැ වි ණි ලැබැගන්නට
රිසි අහර.
[20]අතෙක් තැ නි ණි මහවන රිය
රුසි වහර.
[21]අතෙක් බැ ඳි ණි වළකන දිවි
දිසි පහර.
[22]අතෙක් ලැ බි ණි හැම කමට මැ
නිසි සහර.

ස ල ප ත් කුරුලියෙන් සුළඟේ
සැරුම පැනේ.
ප ල ග ත් කුරු පෙළින් පොළොවේ
මහිම දැනේ.
පැහැපත් ප ත් ර හි න් රිවි පිළි-
කැරුම තැනේ.
අ ත ග ත් ඉරි[23]රහින් [24]අත්මේ
තරම මැනේ.

* * * *

1. සන්නාහය Armour 2. ඉමහත් දිරි 3. පසක්-පැහැදිලි 4. අයත් වන 5, ආත්මය (ජීවිතය) 6. පමා නො කොටැ 7. අළතැත් තතු 8. කිට්ටුවෙන් 9. සිතිවිලි 10. සැකය 11. ගැහැනිය 12 ස්නේහය 13, ගංගාව 14. මතක 15, සන්දිය 16. හද 17. චන්ද්‍රයා 18. මිනිස් 19. ගැහැනිය 20. මහක් 21. ආත්මයෙක් 22. උදව්වක් (පිහිටක්) 23. ආකාරය 24. ආත්මය

පොදු සහතික පත් (G. C. E.) සෝදිසියෙහි

ලක් ඉතිහසට රුකුල

කමල් තිලක

(සටහන් අයුරිනි; දිගට පළ වේ.)

බ්‍රිතාන්‍යයනට ලක්දිව වැදගත් වූ අයුරු

i. පෘතුගීසීන් යටතේ වුව ද ලක් දිවැ වැදගත් කම (කුරුඳු, මැණික් ආදිය නිසා) බ්‍රිතාන්‍යයනට පෙනිණි.— එ හෙත්, පෘතුගීසි බලය පිළිබඳ වැ ඔවුනට එවකට බියෙක් විය.

පසු ව ලක්දිව බෙලහීන ඕලන්දයන් අතට පත් විණි.

ii. 1759 දි මෙ දිවයිනේ වැදගත් කම ඔවුනට යළි වැටැහිණි. නැගෙනහිර ඉන්දිය වෙරළේ සුදුසු වරායෙක් නො වී ය. බෙංගාල බොක්කේ දී නැව් කැඩුණු විටැ අලුත් වැඩියා කිරීම් සඳහා බොම්බායට යා යුතු වැ තිබිණි.

iii. නැගෙනහිර වෙරළට සතුරු උවදුරු ද පැමිණියේ ය. එ නීසා බෙංගාල බොක්කේ නැව් තොටෙක ඇවැසියාව ඔවුනට පැහැදිලි විය.

iv. ලක්දිවැ නැගෙනහිර වෙරළේ අගනා ම වරාය වූයේ තිරිකුණාමලය යි. මෙය විසල් වූත්, මෝසම් සුළං කලැ සුරැකුණා වූත් වරායෙක් වී. එහෙත් මෙය සිංහලයන් සතු විය.

v. කිත්සිරි රා සිං (කීර්ති ශ්‍රී රාජසිංහ) (ක්‍රි: ව: 1747–1782) ඕලන්දයනට විරුදු වැ පෙරදිග ඉන්දිය බ්‍රිතාන්‍ය වෙළෙඳ සමාගමයේ උදව් පැතී ය. 1762 දි ජෝන් පයිබස් නමැත්තා උඩරට එවන ලදී. වරායක් හා කුරුඳු පැවැරීමට රජු එකඟ වුව ද ඕලන්දයනට විරුදු වැ උදව් දීමට මදුරාසි රජය මැළි විය.

vi. 1763 දි හත් අවුරුදු යුද අවසන් විය. වුවමනාව මඳකට අඩු විය. එහෙත් 1775 දි අමෙරිකා නිදහස් සටන ඇති විණි. එනෙක් බ්‍රිතාන්‍යයෝ ඉන්දියාවේ නොයෙක් පැන විසඳමින් සිටිය හ. මදුරාසි රජයෙන් රාජාධිරාජසිංහ (1782–1798) වෙතැ නානාපතියෙක් එවන ලදි. ඕලන්දයන් පලවා-හැරීමට රජුට සිත් වුව ද සිය සොහොවුරාට උදව් නොදුන් අය හා එක් වීම ඔහුට රිසි නො වී ය.

vii. 1782 දි බ්‍රිතාන්‍ය පෙර දිග ඉන්දිය වෙළෙඳ සමාගමය තිරිකුණාමලය අල්ලා-ගත් නමුදු අමෙරිකා නිදහස් හටන අවසනැ දී, මෙය බ්‍රිතාන්‍යයන් ගෙන් මුදගත් ප්‍රංසයෝ එය ඕලන්දයට ආපසු දුන් හ.

viii. 1783 පෙබරවාරි 3 වැනි ද ප්‍රංස රජය බ්‍රිතාන්‍යයට විරුදු වැ යුද්ධ ප්‍රකාශ කෙළේ ය.— යළිත් වරක් ලංකාව ගැනැ උනන්දුවෙක් ඇති විය.

ix. 1795 දි ඕලන්දය ප්‍රංසයට යටත් විය. ඔවුහු එක් වැ බතාවි සමූහාණ්ඩුව පිහිටැවූ හ.

x. ඕලන්ද රාජ්‍යාධිනායකයා එංගලන්තයට පලා ගියේ ය. බ්‍රිතාන්‍ය උදව් පිළිගන්නා ලෙස ලක්දිව සිටි ආංඩුකාරයාට හෙ තෙම සඳෙසක් එවී ය.

xi. මේ අතර තිරිකුණාමලය ගැන උනන්දු වූ මදුරාසි පාලකයෝ රාජාධිරාජසිංහ වෙතැ නානාපතියකු එවූ හ. බ්‍රිතාන්‍ය උදවු පිළිගැනීමට මෙහි ඕලන්ද ආංඩු කාරයා ඇකැමැති නම් ලංකාව අල්ලා-ගැන්මට බල ඇණියක් එවීමට ද මදුරාසි රජය සැරැසිණි.

xii. බ්‍රිතාන්‍ය - ඕලන්ද විරුදුතා පැවැතිණි. ඕලන්ද ආණ්ඩු කාරයා වූ ෆ්‍රන්

එන්ගල් බෙන් බ්‍රිතාන්‍ය උදව් පිළිකෙව් කෙළේ ය. තව ද හෙතෙම බතාවි සමූහ ආංඩුව පිළිගත්තේ ය. බ්‍රිතාන්‍යයෝ ලංකාවේ පහත රට පෙදෙස අල්ලා ගත් හ. එමියන්ස ගිවිසුමෙන් මෙය තහවුරු විස.

මදුරාසි පාලනය

1. ත්‍රිකුණාමලය හැර අන් පෙදෙස් ආපසු දීමේ අදහසෙක් බ්‍රිතානි රජයට විය.

2. එතෙක් ඔවුන් අතින් වැය වූ වියදම් ලබාගැනීම සඳහා බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දිය සමාගමයට පාලන කටයුතු බාර දෙන ලදි. මදුරාසි පාලකයෝ මෙහි පාලනය ඇරැඹූ හ.

3. **අදහස්:** වියදම් 'ආපසු ලබා - ගැනීම හා ලාබයක් ද ලබාගැනීම – හැකි තරම් කෙටි කලෙකින් අධික ආදයම් ලැබීම.

4. මෙ රට ආදයම් ක්‍රම සොයා බැලීමට කල් ගත නොකළ ඔවුහු මදුරාසි ආදයම් ක්‍රමය මෙහි යෙදවීමට සිතූ හ.

5. සිංහල නිලධාරීහු අස් කරනු ලැබූ හ. ඒ වෙනුවට මදුරාසි නිලදරුවෝ පත් කැරුණා හ.

6. සිංහලයන් වෙනුවට බොහෝ තන–තුරුවලට ද්‍රවිඩයෝ පත් කරනු ලැබූ හ. මේ සියල්ල සිංහලයෝ නො රිස්සූ හ.

7. මෙහි තතු කිසිත් නොදත් ද්‍රවිඩ නිලධාරීහු නොහික්මුණු ලෙස හැසිරෙන්නට වූ හ.

ආදයම් පාලනය

1. මුහුදු බඩ පෙදෙස් කොටස් තුනකට බෙදිණි. එක් එක් කොටස බ්‍රිතාන්‍ය නිලදරුවකු යටතේ විය. ඔහු ගේ කම්දෙරුව 'කච්චේරිය' යන දමිළ වදනින් හැඳින්විණි.

2. මෙහි වූයේ ඕලන්ද ඉඩම් භුක්ති ක්‍රමය යි. ගබඩා ගම් රජයට අයත් විය. සෑම ගමෙහි ම සමාගමට අයත් වෙල් යායෙක් විය. එය වගා කළවුනට තෑගි වසයෙන් නින්දගම් දෙන ලදි. යුද සේවය හා මං මාවත් පවත්වා - ගෙන - යෑම ආදී කරුණු සඳහා වැඩවසම් නමැති ඉඩම් දෙන ලදි. මෙහි සිටි පවුල්වලින් එකකු තුන් මසක් රජයේ සේවය කළ යුතු ය. තම පෙදෙසින් පිට යෑමට ගමන් ගාස්තු ඔවුනට ගෙවිය යුතු ය. මේ අත් හිටැවූ මදුරාසි පාලකයෝ ද්‍රවිඩ ක්‍රමය යෙදූ හ.

3. රාජකාරි ක්‍රමය අත් හිටවන ලදි. ඉඩම් මිනිසුනට දීමෙන් අස්වැන්න වැඩි වෙතැ යි ඔවුහු සිතූ හ. අලුත් ක්‍රමය අනුව අස්වැන්නෙන් 2/1 ක් රජයට දියැ යුතු විය.

4. අලුත් බදු ද විය.

උද:- පොල් බද්ද.

පොල් ගස් පනහක් හෝ ඊට වැඩි ගණනක් හෝ තුබුණු පොල් වතු හිමියන් ගෙන් ගසකට පැන්ස 2 බැගින් අය කිරීම.

5. බදු වෙන්දේසියේ දැමීමේ ක්‍රමයෙක් විය.

බදු එකතු කිරීමේ අවසරය වෙන්දේසියේ දමන ලදි. වෙන්දේසිය සඳහා පැමිණි දකුණු ඉන්දිය ජාවාරම් කාරයෝ මේ අයිතිය ලබාගත් හ.

තමනට ඉක්මනින් පිට වැ යෑමට සිදු වන බව සිතා, පමණට වඩා බදු රැස් කැර වැසියන් තළා පෙළූ හ මොවුහු.

6. මදුරාසි නිලදරුවනට විරුදු වැ චෝ–දනා ඇසූ අය ද ඔවුන් වාගේ ම අය වූ හ.— චෝදනාවලින් පලෙක් නැති විය.— "බයි–නෙත්තු උරුක්කර බදු අය කිරීමේ" ප්‍රතිප්‍රත්තිය.

1. මෙ තෙක් කල් බලවත් වැ සිටි මුදලි වරුන් ගැන බියෙක් ඇති විය— ඔවුන් තව පහත හෙළීමේ අදහසෙක් මදුරාසි නිලදරු–වනට විය.

2. මුදලිවරුන් ගෙන් නින්ද ගම් ද අස් කැරගැනිණි.

3. පුරප්පාඩුවලට 'අමිල්ඩාස්' නමැති' දකුණු ඉන්දිය නිලදරුවෝ පත් කරනු ලැබූ හ. ඔවුන් හා පැමිණි අයට ද සුළු පදවි ලැබිණි.

(පිළිවෙළින් එයි.)

කිතු උපත

ගොවියෝ කෙතින් ගොඩට ඇදුණෝ ය. ගොපල්ලෝ සතුන් ගාල් කරන්නට වූ හ. කොල්ලෝ කෙළි පිටියේ දවසට ආයිබෝවන් කී හ. දුරුත්තේ ඇල් සුළඟ ගම් කොනේ ඉඳි ගස් සිසාරා හමා ගියේ ය.

සැන්දෑ වලාකුළු පැළ දික් අහස් ගෙයි වියන් බඳින්නට විය. ඒ වියන්හි ලඹ දුන් මල් සෙයින් රිදී තරු එක දෙක එහෙන් මෙහෙන් පෙනෙන්නට විය. කෙ සේ වුව ද දවිත් මහ රජු ගේ රටේ උතුම් ම සැන්දෑව ඒ වූයේ ය.

මෙ වන් වේලාවේ ද, ගලීලයේ සිට බැත්ලෙහෙමට වැටෙන දෙළොස් ගව් මහ කඩින් කඩ එන මිනිස් පිරිස් නිසා පළින් පළැ අතුරු සිදුරු නැති විය; සිය ගම් බිම් හැර-දමා ඔවුන් එන බවෙකි පෙනුණේ. ඔහු හැම දෙනා එ ද රෑ නවාතැනට නිසි තැන් සොය-සොයා බැත්ලෙහෙමට වන් හ.

ඉන් ඇතැම් කෙනෙක් තානායම්පළ බලා ගියෝ ය. එ සේ යන පිරිස් අතර කොටළුවකු පිටැ නැඟී ගැබිනි මවක හා පයින් ගමන් ගත් පියෙක් ද වී. එහෙත් ඒ යුවළ තානායම් පතියා විසින් ඇතුළු වන දොරටුව ළඟ දී ම වළකන ලද හ. මුදලට ඇරෙන ඒ දොර කෙ සේ නම් හැරේ ද එ වැන්නවුන් හට!

\+ + +

තානායම පතියා ගේ හදෙහි නොපැවැති සිසිලත් තෙතත්, දෙක සුළඟත් වැස්සත් තරඟයට මෙන් හඟවන්නට වී ය. ඔහු ගේ ගෙරවිල්ල පැරුදවූවා මෙන් අහස ගොරවන්නට විය. ඒ නන්නාඳුනන රටේ නුපුරුදු මඟ ඔවුනට පුරුදු කරන්නට මෙන් විදිලිය විටින් විටැ කෙටී. කළුවර, සීතල, විඩාව, සා පවස, අසරණ බව යන මොහු ඔවුන් ගේ තනිය මකන්නට ඔවුන් හා ම ගියේ ය.

\+ + +

"සැමියාණෙනි, බිළිඳා තව නොබෝ වේලාවෙකින් බිහි වෙනවා. මට ඒ බව දැනෙනවා" යි මවු තුමිය කීවා ය. එ බසින් සැලුණේ පියා ගේ හිත පමණෙක් ද? කුණාටුවේ සැටියෙන් මෙන් අවටැ ගස් කොළන් පවා සැලෙන්නට විය. තෙත් වූයේ ඔහු ගේ නෙත් පමණෙක් ද? වැස්සෙහි විලසින් මුළු පොළොව ම තෙත් විය. සට - සටයේ ගැහෙන දතට අනුබලයට මෙන් ඒ හඬ ම ගෙන කො තෙකුත් හිම කැට බිම වැටුණේ ය.

තව එක් පියවරකුත් පෙරට යෑම මවු-තුමියට අමාරු කරුණෙක් විය. අන්න ඒ මොහොතෙහි ඈතැ එළියෙක් පෙනුණේ ය. පොහොසත් මැඳුරෙක මහ පහන යි ඒ. ඒ අසලැ වූ මඩුවෙකි. ඔහු ගේ බැටළු ගාල ඒ ය. හේලි දෙ මහල්ලනට එ රෑ නවාතැන දීමෙහි ඒ හීක් පින් නැති ගාල ම පින්වත් විය.

\+ + +

පහන් වැටක් නැඟූ අයුරින් මහ සහන් එළියෙක් ගාල පුරා පැතිරිණි. බැටළුවෝ උරින් උර හැපී වට මඬුල්ලක් වී හිස ඒ වටයේ මැද දෙසට නමා පිළිම සේ නිසොල්මන් ව සිටියෝ ය. උණුසුම් සුළඟෙක්, මඳකට කලින් පැවැති හිම වැස්ස නිසා ඇති වූ සිසිලේ සැර මකමින් එ අවට මුරට මෙන් කැරකි-කැරකී සිටියේ ය. ගාල මුඳුනෙහි වූ ඉතා මැ දිළිසුණු තරුවෙන් රැස් කඳක් එක එල්ලේ මැ පොළොව කරා පහත් වී ගාලේ සියන සිඹැ සිඹැ සිටියේ ය. දවහල ආ හ යි රැවැටුණු කුකුළා කුක්කුකුව පිරී ය; අව්ත්තියා ද ඒ අනුව ම හඬ නැඟී ය; සෙසු කුරුල්ලෝ තම තමන් ගේ දෑ ගී ගයන්නට වන් හ.

\+ + +

මේ පුදුමය බලන්නට මුලින් ම දිව ආවෝ ගාල මුර කරන ගොපල්ලෝ ය. ඈතැ දී මැ ගාලෙන් නැගෙන බිළිඳු හඬෙක් ඔවුන් ගේ කන් ගති.

එ සේ අද වැනි දිනෙක ලොවැ පහළ වූ සේක, කිතු තුමාණෝ.

\+ + +

නීතිය 7

දිස්ත්‍රික් උසාවියේ අපරාධ නඩු

දම්මිත්

දිස්ත්‍රික් උසාවියෙකින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයෙකින් හෝ ඇසියැ හැකි නඩු දෙ කොටසෙකි.

(1) මුල් පිරික්සුම පවත්වා එ මැ උසාවිවලට මහෙස්ත්‍රාත් උසාවියෙන් ඉදිරිපත් කැරෙන නඩු.

(2) මේ උසාවි මඟින් ඇසියැ හැකි යැ යි අපරාධ විධාන සංග්‍රාහයෙහි දක්වා ඇති නඩු.

මහෙස්ත්‍රාත් උසාවිය මඟින් හෝ දිස්ත්‍රික් උසාවියෙන් හෝ දඬුවම් දියැ හැකි වරද ද, දිස්ත්‍රික් උසාවිය මඟින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් හෝ දඬුවම් දියැ හැකි වරද ද වෙයි. එක් එක් උසාවියට පමණක් වෙන් වූ වරද ද මේ අතර වේ.

දිස්ත්‍රික් උසාවියෙන් නියම කළ හැකි දඬුවම් දෙකෙකි.

(1) බරපතල වැඩ ඇති වැ හෝ නැති වැ. අවුරුදු දෙකකට නොවැඩි සිර දඬුවමෙක්.

(2) රුපියල් දහයකට නොවැඩි දඩයෙක්

වරදකට දඬුවම් වසයෙන් මේ දඬුවම් විදි දෙකට මැ අයත් දඬුවමක් දිස්ත්‍රික් විනිසකරුවකුට නියම කළ හැකි. නීතියෙන් පනවා ඇති හැම දඬුවමක් මැ නියම කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට බලය තිබේ.

දිස්ත්‍රික් උසාවියේ ඇසෙන නඩුවක් අපි දැන් සලකා බලමු. දිස්ත්‍රික් උසාවියේ නඩුවෙකැ පැමිණිලි පස වෙනුවෙන් පෙනීසිටියැ හැක්කේ නීතිපතිට, උවදෙස්පතිට (Solicitor General) හෝ රජයේ 'නීතිඥයකුට' හෝ පමණි. එහෙත් නීතිපති විසින් පත් කරන ලද වෙනත් 'නීතිඥයකුටත්' පැමිණිලි පස වෙනුවෙන් කතා කිරීමට ඉඩ ඇති අපරාධ නඩු ගැනැ පමණක් බල පාන නීතියක් බව අප මතක තබාගත යුතු යි.

තීරණය සටහන් කිරීමට පෙරැ ඕනෑ මැ අවස්තාවෙකැ චෝදනා ඉල්ලා අස් කැරැගැනීමට නීතිපතිට බලය තිබේ. පැමිණිලි පස වෙනුවෙන් පෙනී සිටින 'නීතිඥයාට' දිස්ත්‍රික් විනිසකරු ගේ අවසරය ඇති වැ මෙ සේ කිරීමට පිළිවනි. මෙ සේ වූ විටැ නඩුව නවතා විත්තිකරු නිදහස් කිරීම සිරිති.

නඩුවේ දී පළමු වැ කැරෙන්නේ විත්තිකරුට චෝදනා කියැවීම යි. ඉන් පසු ඔහු වරදකරු ද නිවරදකරු ද යන්න විනිසකරු විසින් අසනු ලැබේ. විත්තිකරු තමා වරදකරු යැ යි පැවැසුව හොත් ඒ බව චෝදනා පතේ සටහන් කොටැ සුදුසු දඬුවමක් නියම කිරීම දිස්ත්‍රික් විනිසකරුවන් ගේ සිරිති. මේ සඳහා අපරාධ විධාන සංග්‍රහයෙන් ඉඩ ලැබේ. විත්තිකරු නිවරදකරු යැ යි පැවැසුව හොත්, නැති නම් වරදකරු ද නිවරදකරු ද යන වග නො පවසා සිටිය හොත්, නඩු විභාගය දිගට මැ පවත්වා-ගෙනැ යනු ලැබේ.

මීළඟට කැරෙන්නේ පැමිණිලි පසේ 'නීතිඥයා' ගේ දෙසුම යි. තම පසෙන් ඉදිරිපත් කැරෙන චෝදනා පිළිබඳ විස්තරයෙක් මොහු විසින් කැරේ. පැමිණිලි පස වෙනුවෙන් කැඳවන සාක්කිකරුවන් ගෙන් සාක්කි විමැසීම මින් පසු වැ කැරේ.

මහේස්ත්‍රාත් උසාවියේ දී මුල් පිරික්සුම පවත්වන විටැ විත්තිකරු විසින් කරන ලද සියලු පැවැසුම්, සාක්කි හැටියට ඉදිරිපත් කොටැ පාවිච්චි කරනු ලැබේ. මෙය කැරෙන්නේ පැමිණිලි පසෙන් කරුණු ඉදිරිපත් කිරීම අවසන් වීමට පෙරැ යි.

පැමිණිලි පසේ කිස නිමැවූ පසු මෙතෙක් ඉදිරිපත් කැරැ ඇති සාක්කි පිළිගත නොහැකි බවක් හෝ වරද ඔප්පු නොකරන බවක් හෝ විනිසකරුට පෙනී ගිය හොත්, ඔහු විසින් විත්තිකරු ගේ නිදෙස් බව (Acquittal) සටහන් කැරේ.

නඩුව දිගට මැ පවත්වා–ගෙනැ යා හැකි නම්, තමා වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරන ලෙස විනිසකරු විසින් විත්තිකරුට අණ කැරේ. විත්තිය වෙනුවෙන් සාක්කි ඉදිරිපත් නොකරන බව විත්තිකරු හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥයා හෝ කියා සිටිය හොත්, තමා ඉදිරිපත් කරන කරුණු පිළිබඳ වැ තව දෙසුමක් කිරීමට පැමිණිලි පසේ නීතිඥයාට ඉඩ ලැබේ. මේ දෙසුම ඔහු කරන්නේ විත්තිකරුට විරුදු වැ ඉදිරිපත් කැරැ ඇති කරුණු පිඩු කොටැ දක්වීම සඳහා යි.

විත්ති පස වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමේ දී සාක්කිකරුවන් ඉදිරිපත් කිරීමටත්, කරුණු පිඩු කොටැ දක්වීම සඳහා දෙසුමක් පැවැත්වීමටත් ඉඩ විත්තිකරුට හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥයාට හෝ ලැබේ.

විත්තිකරු වෙනුවෙන් සාක්කි ඉදිරිපත් කැරුණු විට පිළිතුරු දීමේ අවස්තාව පැමිණිලි පසට ලැබේ. පිළිතුරු කතාවක් පැවැත්වීමට පමණක් නො වැ, විත්තිය විසින් ඉදිරිපත් කැරුණු කරුණු බිඳැ–හෙළීමට, විනිසකරු ගේ අවසරය ඇති වැ සාක්කිකරුවන් කැඳැවීමට ද පැමිණිලි පසට ඉඩ ලැබේ. එහෙත් විත්තිය විසින් ඉදිරිපත් කැරුණේ විත්තිකරු ගේ සාක්කි පමණෙක් නම්, පිළිතුරු දීමේ අවසරය පැමිණිලි පසට නො ලැබේ.

මීළඟට කැරෙනුයේ විනිසකරු ගේ දෙසුම යි. විත්තියත් පැමිණිල්ලත් ඉදිරිපත් කළ සාක්කි පිඩු කොටැ දක්වීමයි ඔහු විසින් කැරෙන්නේ. ඉන් පසු ඔහු ගේ තීරණය රැස් වැ සිටින පිරිසට දන්වනු ලැබේ.

දිස්තිරික් උසාවියේ පැවැත්වෙන අපරාද නඩු පිළිබඳ විස්තරයෙකි මෙ. මේ පිළිවෙළ එ මැ උසාවියේ සිවිල් නඩු සඳහා අනුගමනය නො කැරේ. ලක්දිවැ ඇති උසස් මැ උසාවිය වන ශ්‍රෙෂ්ඨාධිකරණයේ නඩු පිළිබඳ විස්තරයක් ලබන වරැ ලිපියෙන් දක්වේ. ශ්‍රෙෂ්ඨාධිකරණයේ තීරණයට විරුදු වැ රාජාධිකරණයට අයැදියැ හැකි වුවත් බොහෝ අවස්තාවලැ දි මෙ වැනි අයැදුමක් සඳහා ඇවැසි බවෙක් නඩු කියන අයට නො පෙනේ. රාජාධිකරණය මහාබ්‍රිතාන්‍යයේ පිහිටා ඇති හෙයින් ලක්දිවැ ඇති උසස් මැ උසාවිය හැටියට ශ්‍රෙෂ්ඨාධිකරණය සැලැකීම නිවරද වේ.

* * *

"රීතියක් නීතියක් නැති ජන සමාජය මෙන් මැ භාෂාව ද අවුලින් අවුලට වැටෙයි"

— ව්‍යාකරණ විවරණය

පොත් විවිසුව

පිංදෙගෙ හැල

අනදපිය කුඩාතිති

ගත්කරු:— බූස්සේ, පී. පියසෝම
මිල:— රු: 2.00 යි.

"ලේඛකයෝ නවකතා කෙටිකතා ලිව්වෝ ය. 'යළි උපන්නෙමි', 'වෙසඟනක් නිසා යළි උපන්නෙමි' යි ලිව්වෝ ය. නා දළු දෙතොල්, මුතු දත්, තිසර තන, දේදුනු බැම, පෙරළෙන දිය ඇලි, දළු ලන තුරු ලිය, පුබුදින මල් ගොමු, මේ වා ගැන නිතර කවි ගෙතූ හ. එහෙත් මගේ මැණියන් ගේ ගිලී ගිය නෙත්, වැහැරී ගිය සිරුර ඔවුහු කිසි දිනෙක නො දුටුවෝ ය."

මේ, **'පිංදෙගෙ හැල'** නම් කෙටිකතා එකතුවේ 'කා ගේ පිහිට ද' නමැති කෙටි කතාවේ එන වැකි පෙදෙසකි. බූස්සේ පී. පියසෝමයන් ගේ ලියනයෙන් බිහි වූ මෙ පොතට කෙටිකතා එකොළොසෙක් ඇමිණී ඇති. 'කා ගේ පිහිට ද' අපේ දිළිඳු ගැමි දරුවන් විඳුනා දහ දුක් විදහා පාන ඉසැටි පැබැඳුමෙකි. පියාණන් මිය ගිය අසරණ ගැමි පවුලෙකැ එකොළොස් හැවිරිදි නිවහල් කොලුවකු ලවා සිය අසරණ දිවිතතුව කියවන අයුරින් ලියැවී ඇති මෙ කෙටි කතාව කියන්නවුන් සිත් තුළැ කරුණා රසය දනැවෙයි. කතුවරයා එ මැ දිළිඳු දරුවා ගේ මුවට නංවන බස පටුවන් (පාඨකයන්) ගේ සිත පාරව යි. එ මැ පැරුණු සිත අපේ ජනා රැසේ එක් පැත්තක් විඳින ලොවුතුරු සුව, තවත් පැත්තක් විඳින නිරා දුක කෙරේ ඇදී යෙයි. ලිපියුවා (ලේඛකයා) පබඳ කළ යුත්තේ ඉන් ජන රැසට වැඩක් වවනු සඳහා යැ. 'සැහිටියාවේ ස-වග පල' නමින් **සුබසට** පබඳක් සපයන වරකාගොඩැ සිල්රුවන් පඬි හිමිපාණෝ මෙ සේ පවසති.

"සැහිටියාවට වැදූගත් පබඳක් කියැවියැ යුත්තේ සැහිටියාව උදෙසා නො වැ, ඉන් තම හට ස-වග පලයන් නෙළා-ගැනිම පතා යැ. ඒ ස-වග පල නම් කිමැ යත්:-

1. බස් හසර ඉගෙනීම
2. සිත් හසර හැඳිනීම
3. රස විඳීම
4. නුවණ වැඩීම
5. නිමැවුම් හැකියාව
6. සියත් සැකැසියාව"

සැහිටියාවට අරමුණක් තිබියැ යුතු මැ යැ. එ වන් අරමුණක් නැති සැහිටියාව දිවමන් මිනිසුන් සඳහා පැවැතෙන්නෙක් නො වේ. මේ සැබැව වටහා ගත් අපේ පැරණි ගත් කරුවෝ ජාතක කතාවෙන්, කව් පබඳින්, දහම් පබඳින්, නළුවෙන්, ගැමි ගීයෙන් තමන් උපන් රැසට ණය ගෙවන්නට මැ පබඳ කළ හ.

හෙළ දෙසෙහි, රැසෙහි ගුණ වගාවට රුකුල් දෙන, මුලැ සිටැ අග තෙක් මහත් කුහුලින් කියැවියැ හැකි, කියවා රස විඳියැ හැකි කෙටිකතා එකතුවෙකි 'පිංදෙගෙ හැල.'

'අඳුර සහ ආලෝකය' නමැති මෙහි එන මුල් මැ කෙටිකතාව අපේ දනන් ගේ සිතිවිලි වැලෙහි දුබල කම් හෙළි කරයි. 1970 දී කොළොඹට නුදුරු මුහුදු පත්ලේ තිබී තෙදවත් ජන නායුවකු ගේ ලෝහ රුවෙක් හමු වී යැ. එය මෙයට හවුරුදු තිහකට පෙරැ, මුහුදු කැම නිසා මුහුදට ඇද වැටුණෙකි. ඒ පිළිමය ගොඩට ගත්

සිංහලයෝ එය පරංගි සමයට අයත් එකෙකැ යි, යුරෝපා කලාවට නැ කම් කියන්නෙ කැයි, ඉසෙට කලා වටනා කමක් ඇති එකෙකැ යි මහ හඩ නඟන්නට වන් හ. ඒ රුව බලන්නට පැමිණි අවුරුදු අනූවක් පමණ වයසැති මහලු මිනිසෙක් 'ඔන්න මාත් මෝඩ කියමනක් කියනව. මට නම් පේන්නෙ මේක අපේ ඉස්සර සේනානායක අගමැති තුමාගෙ රූපෙ වගෙ යි' යනුයෙන් පැවැසී. ඔහු ගේ මතය නො පිළිගැනිණි. සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ද හවුලින් එය කොළොඹැ කවුගෙයි වීදුරු පෙට්ටියක් තුළැ තැන්පත් කැරිණි, මහ ඉහළින්. එ තුළැ නිසලව හොවිනා මහ පුරිස් තුමෝ මේ සේ සිතන්නට වූ හ. 'මා මෙතෙක් පෙරුම් පුරා වෙරළට ආයේ මුහුදු කැමේ ඇති බැරැරුම් කම සිංහලයනට වටහා දීමට යැ. එහෙත් ඔවුනට මා හඳුනා ගැනීමට පවා අපහසු වියැ. ඔවුන් හැම දෙන ම කතා කෙළේ පිළිමයේ ඇති 'සංස්කෘතිය' සහ කැටයම් සිල්පයේ වටිනා කම් ගැන ය. සිංහලයනට කිසි කලෙක කිසි ම දෙයක් නියම ස්වරූපයෙන් තේරුම් ගත නො හැකි ය.'

මෙය ඇත්තට ඇස් වසා මහ මුළාවන් පසු පසැ දිවෙන අප රටේ වැඩී දෙනා වෙතැ එල්ල කළ තියුණු උවහසෙකි.

'ඕළු මල්', මේ කෙටිකතා එකතුවේ ඉමහත් කුලුණුලු රස දනවන කෙටිකතාව යි. පාසල් ඉසිඹු සමයේ උදයෙකැ බඩ පුරා කිරිබත් කා, පියා පසු පසැ කුඹුරට ගිය කුඩා දරුවෙක් එ මැඳ වූ හැලෙහි ගිලුණේයැ. මරුවා ගෙන් යන්තම් ගැලැවුණු හේ සිය නිවෙසේ සගැනුම් ලබ යි. ඔහු ගොඩ ගන්නා විටැ හැල් පත්ලේ තිබී හමු වූ ඇට කැබැල්ලෙක් වියැ ඔහු ගේ මාමා ගේ අතේ. එ කිමෙකැ යි විමසත් මැ මාමා එ දරුවාට කියා දෙයි පිංදෙගෙ හැලේ යටගිය තොරතුර. පසු ගිය යුද සෙමෙහි රංචො අම්මා නමැති වැන්දඹුවක ඇගේ තුරුණු දුව-පිංදෙ සමඟ දිවියාගල ගමෙහි කුඩා පැල් පතෙකැ විසුවා. ගමේ ගෙවලැ බැළ මෙහෙ කැරැ සපයාගත් සුන් සහල් විකෙන්, පලා කොළවලින් දිවි පවත්වා ගත් හ එ දෙ දෙනා. කුඹුරු යායෙහි වූ ඕළු මල් නෙළන්නට උදෑසනෙකැ ගිය පිංදෙ මෙනෙවිය මඩෙහි එරුණා, ගොඩ එන්නට නො හැකි වැ එහි මැ මළා යැ. දුව නැති වැ පිස්සියක මෙන් ඈ සොයා වෙල හැම තැන මැ දිවූ රංචොට දක්නට ලැබුණේ වෙල අද්දර වූ ඈ ඇඳි චීත්ත රෙද්ද පමණ යි. ගමේ මිනිසුන් ඇය සෙවීමට තැත් ගත් නමුදු ඉන් පලෙක් නො වී යැ. ඉන් පසු එ මැ පෙදෙස 'පිංදෙ ගිය හැල' යැ යි ගැමියන් අතරැ පළට වී. මඳ කලෙකින් පිංදෙ ගිලුණු පෙදෙසෙහි ලස්සන ඕළු මල් පිපිණි. මෙ ද මඩේ එරුණු කුඩාවා බේරා-ගනිද්දී ගොඩට ආයේ පිංදෙ ගෙ කකුල් ඇට කැබැල්ලක් වියැ යුතු යැ යි මාමා කතාව කෙළවර කෙළේ යැ. ඒ ඇට කැබැල්ල දෙස විමැසුම් ඇස දුන් කුඩාවා 'මඩ වගුරේ ගිලී මාත් මළේ නම් එ තැනැ කොතරම් ලස්සන මල් පිපේ ද යි තමාට මැ කියා ගත්තේ යැ.

මෙය උසස් නිමැවුමෙකි. කතාව කඳ ගැත් වූ අයුරු අගනේ යැ. යෙදුණු බස් වහර කතාවට එළියෙකි. ලක්දිවැ දකුණු පළාතේ ගැමියන් දෙඩන බස් වහර මෙහි දී වැඩට ගෙනැ තිබේ. යෙදුණු වැනුම් සබා හුරු යැ. බලන්නැ රූබර දිළිඳු පිංදෙ මෙනෙවිය මඩෙහි එරී මරු වැළැඳ ගන්නා පුවත පැවැසීමට ගත් කරු මවන වට පිටාව.

''කුඹුර ඉතා නිසල යැ. වැහි බිංදුවලින් බර වූ **කළු වළාවෝ** කුඹුර දෙසට පහත් වන්නට වූ හ. ....වැහි දෙවියෝ මෙඝ ගර්ජනාවක් කොට වර්ෂාවක් වැස්සූ හ. ඕළු මල් සිනහ වෙද්දී රූබර කන මඩ

රකුසා ගේ මුව තුළට ම ගියා ය. මෙය සැබැවින් මැ තැනට නිසි වදන් පෙළ ගැසීමෙකි.

පිංදෙ ගිලුණු පසු ඒ හැලේ පිපුණු ඕළු නෙළන්නට කිසිවෙක් නො යති. එය ගත් කරුවා පවසන්නේ මෙ සේ යැ. "එහි පිපෙන ඕළු මල් සුවඳ විහිද එහි ම පර වී ය යි. පසු ද වඩාත් වඩාත් ලස්සන මල් පිපේ." ගත් කරු පවසන්නේ ඇත්ත ම නේන්නම්; පිංදෙ මෙනෙවිය මෙ තැනැ මැ මඩෙහි එරී ඒ ලෝ ගියේ පිපුණු තැනැ මැ සුවඳ විහිද පරවන ඕළු මලක් මෙන් නො වේ ද? තෙල වැකියෙන් ඒ රූබර දිළිඳු ගැමි යොවුන ගේ නො කැළැල් දිවියට ගත්කරු දක්වා තිබෙන්නේ කො තරම් හරසරෙක් ද?

කෙටි අන්දරය වේ වා, කව් පබඳ වේ වා, ගැදි කව වේ වා රුසෙහි ගුණ වගාව පිළිබිඹු කරන එය තව තවත් ඔප ලන එකක් වූ විටැ යැ එහි අගය වැඩි වනුයේ. පබඳක් කරන්නා එහි තමා ගේ රුසෙහි මුහුණුවර ගැන්වියැ යුතු යැ. තම දූ දරුවන් තමන් ගේ මැ මුහුණුවරින් යුතු වීම යැ හැදුණු දෙමා පියන් පතනුයේ, හෙළ දරුවා චීන, ජපාන හෝ පැළ දිගැ රුසෙකැ දරුවකු ගේ මුහුණුවරින් නො වැ හෙළ මුහුණුවරින් මැ සැදියැ යුතු යැ. මෙම කෙටි කතාවන්හි දක්නට ලැබෙන සිරිත් නිමැවුම්හි (චරිත නිරූපණයන්හි) නියම දැ මුහුණුවර දිස්වෙයි. මෙහි එන වැනුම්, උවම් හෙළ-බස් ඌරුව පෙන්වයි. 'බතට මාළු, බඩ ගින්න නිසා දෝ අපට දෙල් වැදැගත් ආහාරයෙක් වියැ. (කාගේ පිහිට ද) ඈ යෙදුම් නියම සිංහල ගැමි වහර දක්වයි. "සැන්දෑ සමයෙහි මේ ගල්කුල කොර-වකුන් ගේ ලැගුම් ස්ථානයක් වෙයි. එ විට එය සුදෝ සුදු දගැබක් මෙන් දිස් වේ." (පිංදෙගෙ හැල) මෙය වදන් තෙලි තුඩින් 'හෙළ රහ' තවරා අඳින ලද මනහර සිත්තමකි.

මෙහි සදෙස් තැන් කිහිපයෙකි. වියරණය නො සලකා හරින ලද තැන් ද නැත්තේ නො වේ. 'ඔහු වැඩ කර යි,' 'ඔහු දිවී.' 'ඔහු ගියේ ය,' 'ඔහු සිනි ය,' 'ඔහු කල්පනා කෙළේ ය' වැනි තැන් පහසුවෙන් සාදගත හැකි වැ තිබිණි. මෙහි බස මුසු වහර (මිශ්‍ර සිංහලය) යැ. කවර සැටියේ අදහසක් වුව ද පැවැසීමට හුදු හෙළ බස පොහොසත් නැතැ යි නො සිතියැ යුතු යැ. අප හැම විට මැ උසහ වැඩිය යුත්තේ සකු, පාලි වදන් වරා, හුදු හෙළ බසින් මැ අදහස් පැවැසීමට යැ. මේ පබඳුවාණන් අතින් මත්තෙහි දී පළවන පත් පොත් හුදු හෙළ බස් වහරින් මැ සැරසෙති යි අපි උදක් මැ පතමු.

හෙළ බස නො දත් ඇතැම් සරසවි ඇදුරන් විසින් ඉංගිරිසියෙන් හිතා අසිංහල-යෙන් ලියන ලද 'හෙලු වැලි අඳුර', 'දෛනික ඇස් රුදව' වැනි අවද යෙදුම් මේ පොතෙහි දක්නට නැති. පැළදිගු සාහිත්‍යයේ ඇති සියලු රීතින් අප විසින් රැක්කැ යුතු යැ යි සිතතොත් ඒ මහ මුළාවෙකි. අනුන් ගේ ලිවිසැරියකට ගැති වී උසස් ලිවිසැරියක් ගොඩ නැඟිය නො-හැකි යැ. කෙටි අන්දර රුසැයුම පැළදිගු හසුවේ (අච්චුවේ) මැ ඔබා නිමැවියැ යුතු යැ යි සිතතොත් ඒ සවරද යැ.

සියත් ගුණයෙන් පිරි කෙටි අන්දර එකතුවක් හැටියට උසස් තැනක් හිමිකැර ගනි යි, **පිංදෙගෙ හැල**.

රුහුණ පුළුල් වීම

සැළකුරු

"රුහුණේ උතුරු මායිම මහවිලි ගඟ නො වේ; ඒ, අඹන් ගඟිනුත් නව ඔබට යා යුතු. එළාර සටනට සිංහලයන් මෙහෙයැවුණු පැරණි මාගම් පුරය ද, දකුණේ ඇති මාගම් පුරය නො වැ අනෙකෙකි. ඒ අනුරාපුරින් මයිල හැටක් හැත්තෑවක් දකුණින් අඹන් ගඟ අසලැ වූ ඇළහැර පෙදෙස බවට දෙස් ලැබේ."

1963. 11. 23. දිනැ මරදනේ ඔව්ටිගල රැස්වීම් හලේ දී මෙළැවුණු කොළොඹැ හෙළ හවුල් මුළුයෙහි දෙස්මක් කෙරෙමින් විදුලකර සරසවියේ යටගියාව පිළිබඳ වදුරු, **සිරිමල් රණවැල්ල** සූරිහු ඉහතැ සඳහන් නව මතය ඉදිරිපත් කළ හ.

මුල්'සුනෙහි වූවෝ අලවිඉසි සැබිහෙළ සූරිහු යැ. **කො. ප. සුසිත්, කීර්ති දිසානායක, කුමරතුඟු හෙම්සිරි** ඈ පින්වතුන් පැන විට සරු කළ අතර ඒ සියලු පැනවලට සකරුණු වැ මැ මුහුණ දුන් හ දෙසුවාණෝ.

"ඔබ තුරුණු යැ; එහෙත් යටගියා නුවණින් පිරිපැසුණෝ යැ. ඔබ මීළඟට කළ යුත්තේ විජයට පැරණි නියම හෙළ යටගියාව මතු කරන දෙස්මක් හෙළ හවුලේ කිරීම යි" — යනුයෙන් පින් දීම කළ **ගැමුණු තිලකවඩුවෝ, රණවැල්ල සූරින්** හට වෙසෙසි ඇරියුමක් කළ හ.

දුහුන පබඳ (269 පිටෙන් එයි.)

මම විදුහලේ සිසු-දෙටුවා නම්!

ගල්කිස්සේ,
සාන්ත තොමොසු විදුහලේ,
කාලිංග විජයවර්ධන

රටෙක හොඳ පුරවැසියකු තමා ඒ රටේ නායකයා වන්නේ. ඒ නිසා නායකයකු වන්න හොඳ මිනිසකු වෙන්න ඕනැ.

අප විදුහලේ නායකයා විදුහල් පතිතුමා ය. ළමයින් ගේ නායකයා නම් සිසුදෙටුවා ය. සිසුදෙටුවකු වීමට හැම හොඳ ළමයකුට ම අයිතියක් තියෙනවා. අයිතියෙන් නායක කම ලැබුණා ම සියල්ලන් ම සලකනවා. අනුන් ගේ පිහිටෙන් නායක කම ලැබුණා ම ඒ විදියට සැලැකිලි ලැබෙන්නේ නැ. අද රටේ සමහරුන් නායක කම් ලැබුවේ අයතියෙන් ම ද කියා මා දන්නේ නැ.

අපේ පහළ පාසලේ සිසුදෙටුවා **සන්සෝනි** ය. සමහර ළමයින් ඔහුට වැඩිය කැමැති නැ. එහෙත් මා නම් නායකයා හැටියට ඔහුට සලකනවා.

හොඳ ළමයකු වුව හොත් මටත් සිසු-දෙටුවා වන්නට පිළිවනි. මට පමණෙක් නො වේ; ඕනැ ම ළමයකුට පුළුවනි.

මා සිසුදෙටුවා වුණා ම පාසලෙත් ගුරුවරුන් ගෙත් දෙමවුපියන් ගෙත් හොඳ නම රකින්නට මහන්සි ගන්නවා. මා යුතු කම් ඉටු කිරීමේ දී හිතවත් යාළුවන් හට වත් අනෙක් අයට වඩා අමුත්තක් කරන්නේ නැ.

නායකයකු ගේ හොඳ ම ලකුණ නම් උඩඟු නොවී ම යි. සමහරුන් නායකයන් වුණා ම අප්පේ! ළඟට කිට්ටු වන්න වත් බැ! මා නම් කිසි ම කලෙක උඩඟු වන්නේ නැ. මා මගේ තනතුර ළමයින් හට හිරිහැරයක් කිරීමට යොදන්නේ නැ. සියලු ම ළමයින් ගේ රැකවලා වන්නේ මම යි.

අපේ මුල් ගුරුතුමා අවවාද දීමට හරි හපනා. සිසුදෙටුවා හැටියට මා පළමුවෙන් ම යන්නේ ඒ තුමා ළඟට යි. ඒ තුමා ගෙන් ලැබෙන අවවාද මට උදව් වෙනවාට කිසි ම සැකයෙක් නැ. ඒ අවවාද අනුව වැඩ කළා ම අවුරුද්ද කෙළවර දී මගෙන් උසස් මෙහෙයක් පාසලටත් මගේ ගුරුවරුනටත් ඉටුවුණා ය කියා මට සතුටු වන්නට පුළුවනි.

(ඉහළ 3 - ෆ)

සහදුව

එළි සකසුවෙනි පැනයෙකි
වද දෙන ම-හ ද
''හෙ සුතන් පුසි'' මෙ කිරිය
මුල-දය-කිම ද?
නමුවක් පතමි එ දයේ,
සකුයෙන් මැ බිඳ
'පෙහෙණියාව' යැ යි
ගත හොත් වැරැදි වෙද?

එළියෙන් හෙළ එළිය
වඩනුවට වැඩි-වැඩියෙන්
ඔබ එළි බල ලබනු රිසි
මෙ වගට - **අනඳ මුණසිහි**

[**පුසි** කිරිය නැඟුණේ පුස්
දයින් වෙද?
'පුස් + ඊ>පුසි' යනු සැලැකුව
නො වැටැහෙ ද?
නම්දුනු පසක්[1] වන
අණි හා බැඳුණු සඳ
පුසණි; පුහණි වි
පොහොණිය ලැබෙයි අද.

පොහොණි මැ පෙහෙණි
වෙයි වහරින් ඉනික්බිති
නම්දුනු නමෙක් මැ යැ
ඒ සිය අරුත්[2] ඇති
පෙහෙණි + ආ>**පෙහෙණිය.**
නැනැ ආ විබති
මෙ නයින් නැඟෙන නමු
පද ඉන් කොනෙක් නැති.

දිවමන් හෙළ වදන් සකුයෙන්
බිඳැ ගන්නෝ
නොදෙඩූ බසක් බව
එ සකුව නො මැ දන්නෝ
දුව ගෙන් මව බිහිය-
වන්නට උසහන්නෝ
මළවුන් හටන් ඉළ
පෙරළෙන හස දෙන්නෝ
— **සකසු**]

2\. සකසුවෙනි, මෙයට ඔබ ගෙන් පිහිට පතමි.

(i) ළමයා වැඩ **කළේ** ය,
ළමයා වැඩ **කෙළේ** ය,
මින් නිවැරැදි කවර එක ද?

(ii) පළමු වන
පළමු වැනි
පළමු **වෙනි**
මින් නිවැරැදි කවරේ ද?

(iii) කුමරතුඟු මුනිදසුන් ගේ අකුරු සැහැල්ල, කවි රසය, නිකම් හැකියාව, දෙ බස් හිණ, හෙළ මියැසිය, කුකවි වාදය යන පොත් දැනට ලබාගත හැකි ද? කොතැ-නින් ද?

— **ඇ. ලෝරන්ස් රණසිංහ**

තිරිකුණාමලේ,
මුත්තුරුවේ,
රජයේ මහ විදුහල.

[(i) කළේ ය, කෙළේ ය යන දෙක මැ නිවැරැදි යැ. කළ + ඒ>කළේ>කෙළේ.

(ii) පළමු වන, පළමු වැනි දෙක මැ හරි. පළමු වන්නා වූ අරුතිනි පළමු වන යනු වන්නේ. පළමු වන බව ඇත්තේ යැ යන අරුතිනි පළමු වැනි යනු යෙදෙන්නේ වන + ඉ>වැනි.

දෙවෙනි, තෙවෙනි යන තන්හි නම වෙනි යනු යෙදෙයි. එ තන්හි පර රූ ගැන්මෙනි ඒ. දෙ + වැනි>දෙවෙනි, තෙ + වැනි> තෙවෙනි. එහෙත් පළමු වෙනි, සිව් වෙනි ඈ තන්හි වෙනි යනු වීමට වියරණයෙන් පිහිට නැති. දෙවෙනි, තෙවෙනි යන තන්හි පළමු වන, පළමු වැනි ඈ තන්හි මෙන් පද දෙකක් නො වැ එකෙකි; සන්දි වූ හෙයිනි.

(iii) කුකවි වාදය, ගුණසෙන් පොත් ගලින් යළි පහරවා ඇති හෙයින් ඒ එ තැනින් හෝ අන් කවර පොත් හලෙකින් හෝ ලැබැගත හැකි වෙයි. සෙසු පොත් ගැනැ පාණදුරේ, පල්ලිමුල්ලේ කුමාරතුංග ගෝමින් විමැසුව මැනැවි.

— සකසු]

3. මේ වදන්වලට හෙළ වදන් පතමි.
(i) Chopstics
(ii) International Development

— සුදත් වීරකෝන්

උණවටුන.

[i පතුරු හැඳි
ii දැබැඳි දිවැඩුම (අඳිවැඩුම)
යනු මනා දැ යි බලන්නැ.

— සකසු]

4. පුරාණ සාහිත්‍යය ය, වර්තමාන සාහිත්‍යය යැ යි බෙදුමකට සිංහලයෙහි ඉඩ ලැබෙ ද?

— (G. K.) මාලිනී

කොළොඹ - 7
'ස්ටැපර්ඩ්' කාන්තා විද්‍යාලයය.

[බස් වහර අනුවැ නම් එ බඳු වෙනසක් නො කළ හැකි සේ යැ.

— සකසු]

5. රොබා එළිය

ඉර බසින විටැ වාගේ ඇති වන සහන් එළියට මේ පෙදෙස් වැස්සෝ 'රොබා එළියැ' යි කියති.

එ සේ කියන්නේ ඇයි?

වෙ. සෙල්තන් සිළු

පනාමුරේ දී යැ.

[ඔබ ගේ පැනයෙහි මැ 'රොබා එළිය, යන්නෙහි තේරුම වෙයි.

රෝ නම් හිරු යැ. බා නම් බැසීම යි.

එ හෙයින් රෝ බා එළිය නම් හිරු බැසැ යන විටැ ඇති වන එළිය යි

රෝ + බා<රොබා වනුයේ බෝ + ළද> බොළඳ, ගේ + දොර>ගෙදොර, වී + ලද> විලද, දූ + මා>දූමා, ඈ වූ සේ යැ.

පැරැණි හෙළ බසෙහි රෝ, හිරු සඳහා යෙදුණු බවට ඉතිරි වැ ඇති දෙස් අතුරින් එකෙකි මේ 'රොබා' යන්න.

වයිරෝඩිය (මිණි), වයිරෝඩි වත්නම්, රෝ දැ රෝ දැ මල් වළා ඈ තන්හි එන රෝ යනු දූ මේ හිරු අරුත මැ දෙයි.

— සකසු]

1. තද්ධිත ප්‍රත්‍යයයක්. 2. ස්වාර්ථ.

* * *

''වි මැ සු ව යි යමෙක් යා නම් නරකාදී
ම ට සු ව යි එහි මැ යනු වෙත'නෙකැ නැදී
ඉ වැ සු ව යි බොරු ව යා නම් සගැ පැදී
ප හ සු ව යි මෙහි මැ වනු ඔහු එහි යා දී

නො පා බිය ඇත්ත ඇති සැටි කියන දන
අ පා ය නම් මරණින් මතු වඩින තැන
සැ පා රෙකැ යි වැනුවත් සුර පුර ගලන
එ පා මට එපා මැ යැ එ තැන සැබැවින''

— කුමරතුඟු මුනිදස්

උඳුවප් මස

උඳු වප් යනු උඳු වපුරන මසැ යි ඇතැමුනට සිතෙනු වියැ හැකි යි. උඳු ගැනැත් බොහෝ පැරැණි කලෙකැ සිටැ මැ අපේ මිනිසුන් දත් බවට වාද නැති.

"උඳුත් නැහැ" යනු අපට සැහිරි (සම්ප්‍රදනුකූල) යෙදුමක් වී ඇති සැටියෙන් ඒ පැහැදිලි වෙයි. එහෙත් මෙ තැනැ - උඳු වප් යන තැනැ, 'සංඥකය' සන්දියක් නිසා වූවෙකැ යි අපට සිතේ. අර වෙසඟ, දියඹ, විලඳ යන ඈ තන්හි වන සංඥකය බලා කවුරු ඒ පද මැ මුල් පද අයුරින් සලකත් ද? ඒ අනුවැ උඳුවප් යන්නෙහි මුල් වදන උදු වප් වියැ යුතු.

වප් යනු වැපිරීම බව අපි දනුමු. උදු නම් කිමෙක් ද?

උදු යනු කෙළින් (ඍජු), මහ යන අරුත් ද ඇත්තේ යැ. එහෙත් ඒ දෙක මැ වප් යන්නට වෙන වෙන මැ වෙසෙසුන් හැටියට ඇඳීමෙන් ද මස හා ගැළැපෙන අරුතෙක් නො ලැබේ. ඒ සේ නම් මේ, 'උදු' යනු ඒ නො වියැ හැකි. වඩනුයේ වඩු, කරනුයේ කරු, බලනුයේ බලු ඈ විසින් උදනුයේ උදු යැ යි, ඒ වදනේ නිපැදියාව කීවත් ඇතැම් විටැ ඒ ඔබට නො තේරෙනවා වියැ හැකි යි. එහෙත් ඔබ ළිප සඳහා පවසන උදුන යන වදන නම් හොඳින් දනිති. කෙ සේ ද ඒ උදුන යන වදන හැදුණේ?

එයින් උදනුයේ — පිසිනුයේ — උදුන යි. මෙහි නයන්න බඳුන, අඳුන, පියන ඈ තන්හි නයන්න මැ යි.

උදුන කුමක් කෙරේ ද?

උදුන බත උදවයි — ඉදීමට සලසයි. උදුනෙහි කීමෙක් වේ ද?

උදුනෙහි බත ඉදෙයි.

දැන් 'උද' පවතුවත් (ධාතුවත්) එහි අරුතත් අපි දනුමු. එහෙත් අස්වනු වග ඉදීමත්, බත් ඈ අහර ඉදීමත් දෙක දෙකෙකි. එ සේ ඒ අරුත් වෙනස් වුව ද උද — ඉදීමෙහි පවතුව නම් එකෙක් මැ යි. ඒ අයුරින් අර වැපිරීම — වප් මසැ වැපිරු, ඉල් මසැ කොළ ඇදී නිල්ල ගැසූ ගොයම — උදවන, පැසීමට සලසන මස උදුවප් වෙයි.

* * *

එළියට එවන පැබැඳුම්

ගල්කිස්සේ. හුළුදගොඩ පාරේ 20./1 හි

එළියේ සකසුවන් නමට එවුව මැනැවි.